ජවයෙන් ඉදිරියට

EDCS 96 වැනි

අභිමානවත් සැමරුම



ඇතුළත

කතුවැකිය
සභාපතිතුමාගේ පණිවිඩය
ලේකම්තුමාගේ පණිවිඩය
කර්තෘ මණ්ඩල පණිවිඩය
96 වසරක ප්‍රත්‍යාවලෝකනය
ප්‍රතිභා
කෙටි කතාව
වැඩවසම් සමුපකාරය
නිහඬ අටවැනි තට්ටුව
දයාබර දියණිය
ඡායාරූප මතකාවර්ජනය
ආයතන නාමාවලිය
සිතුවම්



කතුවැකිය:
සහසර සිතුවිලි

පුරා වසර 96ක පියසටහන් සමග අධ්‍යාපන සමුපකාර සමිතියේ සාමාජික හා සේවක ප්‍රජාවගේත් ඔවුන්ගේ දූ දරුවන්ගේත් සංස්කෘතික ජීවිතය පුළුල් කිරීම තුළ සහකම්පනයෙන් යුතු මිනිසකු සමාජයට දායාද කිරීම අරමුණු කොටගත් අධ්‍යාපන සමුපකාර සංස්කෘතික කවය 'සහසර' ත්‍රෛමාසික සඟරාව ඔබ අතට පත්කරනුයේ ඉමහත් සතුටිනි.

සහකම්පනය, සහජීවනය, සහයෝගීතාව තුළ 'සහ' යන බැඳීම් අර්ථයද ගලා යන සප්ත ස්වර නිර්මාණ ප්‍රතිභාවයේ හැඟීමත් එක් කරන 'සර' අර්ථයද බැඳී පුළුල් නිර්මාණ අවකාශයක් කරා 'සහසර' අධ්‍යාපන සමුපකාර ත්‍රෛමාසික සඟරාව කලඑළි දැක්වේ.

මෙම ත්‍රෛමාසික සඟරාව ඔබගේ නිර්මාණ මෙන්ම සමුපකාර, සංස්කෘතික හා අධ්‍යාපන ඉසව් මෙන්ම අධ්‍යාපන සමුපකාර සමිතියේ සාමාජික හා ප්‍රජා සේවාවන් ද කැටිව නිර්මාණය වේ.

නිර්මාණ කාර්යයෙන් සාමාජික, සේවක හා ඔවුන්ගේ දූ දරුවන්ට දායකත්වය දැක්විය හැක. මෙම ත්‍රෛමාසික සඟරාවේ 'ප්‍රතිභා' විශේෂාංගය වෙන් කෙරෙනුයේ ඒ වෙනුවෙනි.

මෙම සඟරාව එළිදැක්වීම සඳහා ඉතා ඕනෑකමින් මගපෙන්වීම් සිදුකළ හා නිසි අවසරයන් ලබාදුන් සමිතියේ ප්‍රධාන සභාපති එම්.ජී.එල්. ලාල් කුමාර මහතා ඇතුළු ගරු අධ්‍යක්ෂ මණ්ඩලයට හා නිරන්තර සොයා බැලීම් සිදු කරමින් අප දිරිමත් කරනා ප්‍රධාන විධායක නිලධාරී ඒ.එම්.සී.පී.කේ. ගුණසේන මහතාටත් සංස්කෘතික කවය ලෙස අප ස්තුතිවන්ත විය යුතුමය.

එසේම ඉතා කෙටි කාලයක් තුළ ඔබගේ නිර්මාණ අප වෙත යොමු කොට අප දිරිමත් කළ ඔබ සැම ද සිහිපත් කරන්නේ ළබැඳි සිතිනි.

ඔබේ නිර්මාණ කලාව ඔප්නංවා ගැනීමට අප සමග නිරන්තර අත්වැල් බැඳගැනීමට සුහද සිතින් ඇරයුම් කරමු.

සහසර කර්තෘ මණ්ඩලය
සංස්කෘතික කවය වෙනුවෙන්

සභාපතිතුමාගේ පණිවිඩය



96 වසරක අභිමානය සමරන අධ්‍යාපන සමුපකාර සමිතිය වර්තමාන සමාජ සංස්කෘතික පරිසරය හා තදින් බැඳී පවතී. අප සමාජය තුළ කාලයක් තිස්සේ විවිධ ආර්ථික, දේශපාලන විපර්යාසයන් හේතුවෙන් ගොඩනැගී ඇති පසුගාමී විෂම සංස්කෘතීන් දියුණු සාමාජයක් ගොඩනැගීමට බාධාකාරී වී ඇත.

වැඩ පරිසරයක් තුළ එකම ප්‍රජාවක් ලෙස කටයුතු කිරීමට උසස් සංස්කෘතික ලක්ෂණ පැවතිය යුතුය. අධ්‍යාපන සමුපකාරය තුළට ද එය පොදුවේ. එක් එක් පුද්ගලයන් ආදර්ශ සැපයීම හෝ ඒ සම්බන්ධ කතා කිරීම තුළ පමණක් නව සංස්කෘතික මිනිසුන් හෝ නව සංස්කෘතියක් ගොඩනැගීමට නොහැක. එය වඩාත් නිර්මාණාත්මක සෞන්දර්යාත්මක ලෙස සමාජගත කිරීම තුළ මෙම කාර්යය ඉතා පහසුවෙන් සිදුකිරීමට හැකියාව ලැබේ. අධ්‍යාපන සමුපකාර සමිතියේ සංස්කෘතික කවය එහි එක් පියවරක් ලෙස ''සහසර'' සඟරාව එලිදැක්වීමට ක්‍රියාකිරීම නව මානයක් ඔස්සේ සංස්කෘතිය ගොඩනැගීමට ගන්නා උත්සාහයක් ලෙස අගය කරමි.

බොහෝ විට මිනිසුන් ගැටුම් කරා යොමු වන්නේ සංස්කෘතිකව නොදියුණු තත්ත්වයන් තුළයි. සෑම මිනිසකු තුළම සැඟව සිටිනා සාහිත්‍යකරුවකු සිටී. එය සංස්කෘතික සමාජයට නිරාවරණය නොවීම බේදජනක සමාජ තත්ත්වයකි. සංස්කෘතික කවය ලෙස අපගේ ප්‍රයත්නය වන්නේ එසේ සැඟව සිටිනා සාහිත්‍යකරුවා ඔපමට්ටම් කොට සමාජගත කිරීමටයි. එනම් විසිර පවත්නා ප්‍රතිභාවයන් ප්‍රකෘතියන් තුළ සෞන්දර්යාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කොට සමාජගත කිරීම තුළින් සංවේදී මිනිසෙකු බිහිකිරීමටයි. එය මානවවාදී සංස්කෘතික මිනිසෙකු බිහිවීමෙන් එකමුතුව හා සාමූහිකව වැඩකිරීම පහසු කරයි. එවැනි මිනිසුන් සිටිනා සමාජය බොහෝ සෞම්‍ය හා මෘදු මෙන්ම අන්‍යෝන්‍ය සහජීවනයෙන් යුතු සමාජයක් වේ.

අධ්‍යාපන සමුපකාර සමිතිය ලෙස අපගේ උත්සාහය එවැනි සමාජයක් ගොඩනැගීමට පළමු පියවරක් තැබීමයි. මෙය මානවවාදී දියුණු සමාජයක් ගොඩනැගීමේ ගමනේ පියවර වනු ඇතැයි සිතමි.

අප නිර්මාණය කිරීමට අපේක්ෂා කරනා නව සංස්කෘතික සමාජයේ මානව ප්‍රේමය වර්ධනය කරනා දියුණු සාමාජයක් ගොඩනැගීමට මෙම සඟරාවට නිර්මාණ යොමුකරමින් මහඟු දායකත්වයක් දක්වනු ඇතැයි සිතමි. එසේම සමිතියේ සාමාජික හා සේවක සැමටත් ඔවුන්ගේ දූ දරුවන්ටත් නිර්මාණ කාර්යය තුළින් මෙම සෞන්දර්යාත්මක මාවතට පිවිසෙන ලෙසත් සහසර සඟරාව සමඟ සමීපව කටයුතු කරන ලෙසත්, ආරාධනා කිරීමට මෙසේ අවස්ථාව කරගනිමි. එසේම සංස්කෘතික කවය ලෙස සාමාජික හා සේවක ප්‍රජාවගේත් ඔවුන්ගේ දූ දරුවන්ගේත් සංස්කෘතික හැකියාවන් ඔප්නන්වාලමින් දියුණු සමාජ සාරධර්මයන්ගෙන් යුත් හා සහකම්පනයෙන් යුත් පුද්ගලයෙක් සමාජයට දායාද කිරීමට කරන්නට දරන උත්සාහයට සුබපැතුම් එක් කරන මේ මොහොතේ ඔබගේ නිර්මාණ කාර්යය වඩා වර්ධනය කර ගැනීමටත්, ඒ තුළින් උසස් සංස්කෘතික අගයක් සමාජගත කරන්නටත් ආරාධනා කිරීමට මෙය අවස්ථාව කර ගනිමින් ඔබ සැමට සුබපතමි.

එම්.ජී.එල්. ලාල් කුමාර
ප්‍රධාන සභාපති

ලේකම්තුමාගේ පණිවිඩය



වසර 96 ක විවිධාකාරයේ වත්කම් හා වගකීම් රැසක් ශේෂ පත්‍රයට එක් කර ගත් අධ්‍යාපන සමුපකාර සමිතියේ ඉතා වටිනාම වත්කම වූ සාමාජික හා සේවක ප්‍රජාවගේත්, ඔවුන්ගේ දයාබර වූ දරුවන්ගේත් කලාකාමීත්වය, සෞන්දර්යාත්මක බව හා පරිකල්පිත හැකියාව ඉහළ නංවාලමින් යහපත් සාමාජයීය මෙන්ම අන්‍යෝන්‍ය ලබැඳියාවන් සමග මුසු උසස් සංස්කෘතියකට උරුමකම් කීමට හැකි සමාජයක් ගොඩනැගීමට ගනු ලබන සාමූහික ප්‍රයත්නයේ පළමු පිය සටහන ලෙස මෙම සහසර ත්‍රෛමාසික සඟරාව හැඳින්විය හැකිය.

යුගයේ අවශ්‍යතාවයක් වන අන්‍යෝන්‍ය බැඳීම මෙන්ම සහකම්පනයෙන් යුතු මිනිසුන් සමාජයට අවැසිම කාලයක් අප පසු කරමින් සිටිමු.

එවැනි සහකම්පනයෙන් යුතු මිනිසුන් සමාජගත කරන්නට මෙම සඟරාවෙන් සැලකිය යුතු දායකත්වයක් දක්වනු ඇතැයි මම උදක්ම විශ්වාස කරමි.

උපතින්ම කලාකාමී වන මිනිසා තමා තුළ ඇති කලාකාමී හැඟීම් නිර්මාණාත්මකව එළිදක්වන්නේ ඉතාමත් කලාතුරකිනි. බොහෝ මිනිසුන්ගේ කලාකාමී හැඟීම් ඔවුන්ගේ හිත් තුළම මියැදී යන්නේ එය එලිපෙහෙලි කිරීමට මගක් නොමැතිවීම හෝ සමාජයේ පවත්නා විෂමතාවයන් නිසාවෙනි.

වර්තමාන සමාජ, ආර්ථික, දේශපාලනික තත්ත්වයන් තුළ නව සංස්කෘතියක්, උසස් සංස්කෘතියක්, උසස් ලෙස සිතුම්, පැතුම් ජනිතවන මිනිසුන් හා සාමූහිකත්වයන් අගය කරන මානව ප්‍රේමය කැටිකරගත් මිනිසුන් බිහිකිරීම අත්හැරිය නොහැකි වගකීමකි.

ඒ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික තත්ත්වයන් නිසි පරිදිම හඳුනගෙන ඇති අධ්‍යාපන සමුපකාර සමිතියේ සංස්කෘතික කවය සහසර සඟරාව එලිදැක්වීමට කටයුතු කරන මෙම මොහොතේ එයට කැපවී ක්‍රියා කළ සංස්කෘතික කවයේ සැමටත් නිර්මාණකරණයෙන් දායකත්වය දැක්වූ සැමටත් සුබපැතුම් එක්කරන අතරම අද දින මෙසේ තබන පළමු පියවර යහපත් සමාජයක් ගොඩනැගෙනා තුරු ඉදිරියට යාමට ශක්තිය, ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ක්‍රිශාන්ත කවිකාර
ප්‍රධාන ලේකම්

ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය



1930 වර්ෂයේ නොවැම්බර් 01 දින සාමාජිකයින් 58 දෙනෙකුගෙන් ආරම්භ කරන ලද මෙම අධ්‍යාපන සමුපකාර සමිතිය වර්තමානයේ දකුණු ආසියාවේ විශාලතම සාමාජික සංඛ්‍යාවට හිමිකම් කියන සමුපකාර සමිතිය වී ඇත.

230,000 ක පමණ සාමාජිකත්වයක් සහිතව 2026 නොවැම්බර් 01 දිනට අභිමානවත් 96 වසර සමරන මේ මොහොතට සමගාමීව සමිතියේ සංස්කෘතික කවය එක්ව එළිදක්වන ''සහසර සඟරාවට'' ශුභාශිංසන එක් කරමි.

96 වසරක ගමන්මග තුළ සමිතිය වෙත ජවය ශක්තිය ලබාදුන් සාමාජික හා සේවක ප්‍රජාව සිදු කළ අපරිමිත කැපකිරීම් ප්‍රමාණය පිළිබඳ සිහිපත් කරනුයේ හදපිරි සතුටිනි.

අධ්‍යාපන සමුපකාර සමිතියේ ජීවනාලිය වූ මෙම සාමාජික ප්‍රජාවගේත්" කාර්ය මණ්ඩලයේ සැමගේත්" ඔවුන්ගේ දූ දරුවන්ගේත් නිර්මාණ කාර්ය වැඩි දියුණු කරමින් සෞන්දර්යාත්මක පණිවිඩයක් සමාජ ගත කරන්නට දරන ප්‍රයත්නයක් ලෙස නිර්මාණය වන ''සහසර සඟරාව'' තව තවත් වැඩි දියුණු වී ඔබ සැමගේ නිර්මාණ කලාවට ඵලදායී තෝතැන්නක් වේවායි ප්‍රාර්ථනා කරමි.

ඒ.එම්.සී.පී.කේ. ගුණසේන
ප්‍රධාන විධායක නිලධාරී

96 වසරක ප්‍රත්‍යාවලෝකනය





අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society

හැඳින්වීම

සමිතියේ සාමාජික මහත්ම මහත්මීන් 230,000කගෙන් ගොඩනැගී ඇති අධ්‍යාපන සමුපකාර සමිතියේ අරමුණු වනුයේ සාමාජික ආර්ථික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සහන පොලී යටතේ මූල්‍ය පහසුකම් ලබාදීම, සකසුරුවම හා මුදල් ඉතිරි කිරීමේ ක්‍රම හඳුන්වාදීම හා සාමාජිකයින් ඒ සඳහා පෙළඹවීම, සාමාජික දරුවන්ගේ අධ්‍යාපනික සංවර්ධනයට හේතු වන සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම, පවුලේ සාමාජිකයින් සමඟ විවේකය ගත කිරීම සඳහා අවම මිලක් යටතේ නිවාඩු නිකේතන පහසුකම් සැලසීම වැනි කාරණායි.

1930 ජූලි 15 වැනි දින අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවක සේවිකාවන් කිහිප දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමකදී ගන්නා ලද තීරණයකට අනුව එවකට පැවති සමුපකාර නීතිය යටතේ 1930 නොවැම්බර් 01 දින සී/ස අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මුදල් ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය වශයෙන් අංක : 736 යටතේ ලියාපදිංචි කර සාමාජිකයින් 58 දෙනෙකුගෙන් ආරම්භ කරන ලද අධ්‍යාපන සමුපකාර සමිතියට අද වන විට වසර 96ක් සම්පූර්ණ වී තිබේ. මේ වන විට සීමාසහිත සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය නාමයෙන් හැඳින්වෙන දකුණු ආසියාවේ විශාලතම සාමාජික ශක්තියෙන් යුත් සමුපකාර සමිතිය ලෙස සිය සාමාජිකයන් වෙත හා සමාජය වෙත සිය යුතුකම් ඉටු කරමින් සිටියි.

දැක්ම

සමුපකාර ප්‍රතිපත්තිවලට අනුකූලව සාමාජික හා ප්‍රජා අවශ්‍යතා ඉටුකරදෙන ප්‍රමුඛතම තිරසාර සමුපකාර මූල්‍ය ආයතනය වීම.

මෙහෙවර

සමුපකාර ප්‍රතිපත්තිවලට අනුකූලව ආයතනයේ මූල්‍ය, භෞතික හා මානව සම්පත් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කරමින්, නවීන තාක්ෂණය හා කළමනාකරණ ක්‍රම භාවිතා කර, තෘප්තිමත් සේවක පිරිසක් මගින් එම සම්පත් ඵලදායිව හා කාර්යක්ෂමව උපයෝගී කර ගනිමින් සාමාජික හා ප්‍රජාවට උපරිම ප්‍රතිලාභ ලබාදී ඔවුන්ව සවිබල ගැන්වීම තුළින් ජාතික සංවර්ධනයට දායක වීම.

වටිනාකම

- දිවයින පුරා ස්ථාපිත ශාඛා කාර්යාල 26 කින් සමන්විත වීම හා දිවයින පුරා විසිරී සිටින 230,000 පමණ සාමාජිකත්වය.
- නවීන තාක්ෂණික දැනුමක් සහිත මෙන්ම පුළුල් සමාජීය හා ආයතනික සම්බන්ධතා රැසක් සහිත කැපවීමෙන් කටයුතු කරන බුද්ධිමත් හා පළපුරුදු නායකත්වය.

- සමස්ථ බල ප්‍රදේශය වන ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින 384 කින් යුත් මහා සභා නියෝජිත පිරිස.
- සමුපකාර ක්ෂේත්‍රයේ මෙන්ම විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් සහිත කාර්ය මණ්ඩලයක් සිටීම.
- සාමාජිකයාගේ අවශ්‍යතාව අනුව ඉතාමත් කෙටි කාලයකදී ඉතාමත් පහසුවෙන් ණය මුදලක් ලබාගත හැකි වීම.
- සාමාජික ප්‍රජාවටත් පොදු මහජනතාවටත් දේශීය සංචාරයේදී ඉතා සහනදායී මිලට නවාතැන් පහසුකම් නුවරඑළිය හා අනුරාධපුර නිවාඩු නිකේතන මගින් සැපයීම.
- පහසු කොන්දේසි මත සාමාජික අවශ්‍යතා අනුව ඉතා කෙටි කාලයකදී ණය මුදල් ලබාගැනීමේ හැකියාව හා ණය වර්ග රැසක් හඳුන්වා දී තිබීම.
- ණය ලබාගත් සාමාජිකයාට සිදුවන හදිසි විපත් තත්ත්වයන්හිදී ඇපකරුවන් හා පවුලේ උදවිය පීඩාවෙන් මුදා ගැනීමට ණය ආරක්ෂණ අරමුදලක් පිහිටුවා තිබීම.
- සාමාජිකයින්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් අත්වැලක් සැපයීමට 5 ශ්‍රේණිය සමතුන්ට හා විශ්වවිද්‍යාල සමත්වන දූ දරුවන්ට ශිෂ්‍යත්ව ආධාර සැපයීම.
- සාමාජික හදිසි ආපදා තත්ත්වයන්හිදී ඔවුන්ට ශක්තියක් වීමට ආපදා සහන ආධාර හා සහන පොළී ණය ලබාදීම.
- විශ්‍රාම, මරණාධාර යෝජනා ක්‍රමයන් පවත්වාගෙන යාම.

අරමුණු

- සාමාජිකයින් තුළ සකසුරුවම්කම හා අන්‍යොන්‍යාධාරය හා ආත්මාධාරය පිළිබඳ හැඟීම හා ව්‍යවහාරය ඇති කිරීම.
- සකසුරුවම්කම වර්ධනය කිරීම සඳහා මාසික ඉතුරුම් මුදලට අමතරව තැන්පත් ප්‍රවර්ධනය කිරීම.
- සාමාජික සේවා වැඩි දියුණු කිරීම හා සාමාජික පහසුව සැලසීම සඳහා ශාඛා විමධ්‍යගත කිරීමට ඇති හැකියාව පිළිබඳ ශක්‍යතා අධ්‍යයන නිරන්තර සිදු කිරීම.
- ඵලදායී සේවා ලබාදීම සඳහා කාර්ය මණ්ඩලයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක බව ඉහළ නැංවීම.
- වෙනස් වන සමාජ ආර්ථික පරිසරයට අනුව ව්‍යාපාරික කටයුතු නවීකරණය කිරීම.
- සමිතිය තුළ කාලයක් රැඳී සිටින සාමාජිකයා ඔවුන්ගේ රාජකාරී විශ්‍රාම යාමත් සමඟ සාමාජිකත්වය අහෝසි වීම තුළ හුදකලාවීම වළක්වා ගැනීමට ආශ්‍රිත සාමාජිකත්වය අනුගත කොට ක්‍රියාත්මක කිරීම.
- සාමාජිකයාගේ අවශ්‍යතාවය කාර්යක්ෂමව, සුහදශීලිව, කඩිනමින් ඉටුකර දීම තුළින් සමාජික තෘප්තිය වැඩි කිරීම.
- අධ්‍යාපන සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යයන් වන්නේ සමිතියේ සාමාජිකයින්ගේ සකසුරුවම්කම වර්ධනය කරමින් සෘජු මූල්‍ය හා සාමාජීය සේවාවන් සැපයීමයි.
- සමිතියේ මූල්‍ය පදනම සහ ප්‍රාග්ධනය ශක්තිමක් කිරීම සඳහා සාමාජිකයින්ගේ සාමාන්‍ය ඉතුරුම්, ස්ථාවර තැන්පතු,කොටස් මුදල් සහ විශේෂ අරමුදල් විනිවිදභාවයකින් යුතුව එකතු කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. සමිතියේ විශේෂ අරමුදල් වන්නේ,
- විශ්‍රාම හා මරණාධාර පාරිතෝෂික යෝජනා ක්‍රමය
- සාමාජික හා සාමාජික ඥාති මරණාධාර යෝජනා ක්‍රමය
- විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය
- ණය සහන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- සාමාජික සුබසාධන අරමුදල
- සාමාජික නොවන ස්ථාවර තැන්පතු
- ළමා ඉතුරුම් හා ස්ථාවර තැන්පතු



අම්මාට

ඉරකි නුඹ මට ලොවක් උණුසුම් කරන
සඳට උපමා කළත් සැමදෙන
ලොවක් පවතින්නේ ඉර නිසාමැය
ඉතින් මම සඳට උපමා කරන්නේ
කෙසෙද නුඹව...
සඳක් දිලිසෙන්නේ ඉර එළිය වැටුනාම
මමද දිලිසෙනවා නුඹේ එළිය වැටුනාම
ලොවක් ලස්සන වෙන්නේ ඉරක් දිදුලාම
කවුරු නොකියයිද ඉර එළියේ උණුසුම
හදවතට දැනුනාම...

සඳට උපමා කළත් නුඹේ මුහුණ
සෙනෙහස දැනෙයි ඉරසේම
දස මසක් කුස තුළ දරාන
වින්ද දුක් කඳුළු ඇත බොහෝම...

දෙනෙත් කිරි දුන්නේ තුරුලේ මා හංගාන
දුන්න ඔවදන් මතකයිනේ මට තාම
මතු සසරේ උපදින හැමදාම...
පතනවා උඹේ කුසේම ගුලිවෙන්න

මමත් පතනවා අම්මේ මතු සසරේ
නුඹවත් බුදු වෙන්න...

ආර්. කේ. අඹගස්පිටිය
සේවා අංක 1910
නුවරඑළිය

අපේ සතුටු පියස

අකුරු කළ සිප් සතර ලොවට බෙදන
ගුරු සිත් නිවන සත්කාර සෙවනේ
සමුපකාරයේ සොඳුරු පියසයි මේ...

සාමාජික සැමගේ දියුණුව පතා
එක්ව නැගිටින සහෝදරත්වයෙන් දෑත් බැඳි
සැබෑ මිනිස් සුවඳ රැඳී තැනයි මේ...

වැඩ රාජකාරී දිය ඇල්ලක් වුවද
ලෙන්ගතු සිනහවෙන් සිත සැහැල්ලු කරන
නිවනක් වන් සුවඳයි නිවහනයි මේ...

අධ්‍යාපන සේවයේ අභිමානය දර
හෙටත් එන්නට ආස හිතෙන
අපේම සතුටු පියසයි මේ...

ඩී. එම්. දේශානි දිල්හාරා
සේවා අංක - 2450
මොනරාගල





අවසානයේ ඉතිරි වන්නේ

ධනය රැස් කළෙමු
තනතුරු සෙව්වෙමු
නමක් ගොඩනගන්නට
ජීවිතයේ බොහෝ කාලයක් කැප කළෙමු

ඒ අතරේ
අප වෙනුවෙන් බලාසිටි
හදවත් කිහිපයක්
නිහඬව වයසට ගියහ

දවසක ආපසු හැරී බැලූ විට
අපට වැටහෙනු ඇත

ජීවිතයේ වැදගත්ම දේ
අප රැස් කළ දේ නොව
අප අහිමි කර නොගත යුතුව තිබූ දේ බව

ජීවිතය දිනන්නට යන ගමනේදී
ජීවිතයම අහිමි කර නොගන්න

ආර්. ඒ. ඩබ්. සී. ජයසේන
සේවා අංක 2544
නුවරඑළිය

පමා වී ආ වසන්තය

පාළු කතරේ
තනි වී සිටින
පුංචි පැළයක් වී
වසන්තය නෑ එන්නේ තාමත්
කොතෙක් ඉවසා සිටියත්
බොහෝ කලක්
ඇත තවමත් වසන්තය පැමිණ
කොතෙකුත් බාධා තිබුණත්
ඇත තවමත් නොසැලේ
අල්ලාගෙන සිටියත් වෙහෙසකර යුගයක්
කල් ගතවුවත් ජීවිතය
නැවත පැමිණිය වසන්තය
නැවත දළුලා වැඩෙයි හනික
නැගිට පණ එමි නැවත
නොසැලී නොසිට
එළිය කරන්නෙමි ලෝකය
වසන්තයේ වැජඹෙන තරුවක් ලෙසට
එළිය කර ලෝකය
නිවී යන්නෙමි සතුටුව

කේ. ඒ. සුපුන් සඳුනිල්
සේවා අංක 1867
නුවරඑළිය

සුජ්පා දේවියට

යනෙන මං නැති වීදි වල විත් වනේ මං පෙත දිග ඇදුනා
අතරමං වූ හුදකලාවක නුඹ ඇවිත් මගෙ හදට එබුණා
අසම්මත වුව මිනිස් දුවකට හදවතේ ඉඩ තදින් දැනුනා
ඒක හින්දම ලෙනේ සිරකර නුඹත් දරුවොත් හොඳින් වැඩුනා

කුසට ගින්නක් නොදී උස්කර හැදූ දරුවොත් අහිමි කෙරුනා
රුවට නොව මා පෙමින් බැඳුනෙම නුඹේ හදටයි උරන නොවුනා
රැලට නොයවා සෙනේ සොයමින් දාරකේ පෙම් හීන මැවුනා
පැලී මියැදෙන හිතේ දුක් කඳ ස්නේහේ නැති තුන් හදක වෙළුනා

උරුම සොයමින් මාව හැර ගිය නමුදු වරදක් බෑ කියන්න
කිරුළු පැළඳුව දාට පුතුනේ බිඳක් ලෙන් දොර ළඟට එන්න
සීවලි මගෙ දුවේ නුඹ තව හොඳින් මේ ලෝකය දකින්න
සිංහයෙකුට වූ නමුත් මේ හද පියෙකු බව සිහි තබාගන්න

ලලනි රත්නායක

මිනිස්සු

උණුසුම් අවන් වල
සෙනෙහස නතර වුනා

වැසි දිනක කොළය යට
සිටිමි ආවරණයක් වූ

ගමෙහි කහ පාට කොළ
පාරට වැටුනු දවසක
දොස් කීහ
මිනිස්සු..

ලැබුණු සෙවන
අමතක වන්නට
එක වියළි කොළයක්
ඇති බව
කියාදුනි..

පාර අයිනේ විශාල ගස

අනුරාධා
සැපයුම් අංශය

සුචරිතවාදීන් භෝජන වැළඳීම



පණ ගැහෙන ලේ කැටිය
පිහි පහර කිහිපයකින්
වෙන් කෙරුවේ මැන බලා
කිලෝ එක හරියට

කටු නැතිව හොඳවැයින්
මට දෙන්න කිලෝවක්
පොඩි එකා කන්නේ නෑ
මස් නැතිව බත් කටක්

ලේ නැතිලු මගේ ඇගේ
වැඩ කරලා හති වගේ
ඉඳ හිටලවාත් කන්න
නැද්ද පීකුදු මෙහේ

ඩ්‍රිල් කරලා සෝස් දැමූ
හොඳ බීෆ් පෙති දෙකක්
පෝක් දැමූ ඉස්ටුවක්
කාලෙකින් කෑවේ නෑ
එක චිකන් කොත්තුවක්

අපි නොවෙයි මරන්නේ
කන එකයි කරන්නේ
චේතනාහං භික්ඛවේ
බුදු බනෙත් තියෙන්නේ

රථ දෙකක් හැප්පිලා
මරණයක් සිදුවෙලා
මස් කඩේ මුදලාලි
රෝදෙටම අහු වෙලා

අපිට නම් නෑ දුකක්
ඔය ගෙව්වේ කල පවක්
කියනවා මට ඇහුනි
ඇගේ ලේ අඩු කෙනෙක්

සුජිත් සමන් කුමාර විජේසුරිය
සේවා අංක 1110
කෑගල්ල

මගේ ආදර අම්මා

හොවා ළය තුළ දසමසක්
දරා ගින්දර මහාමෙරක්
මා මෙලොවට බිහි කළ
මගේ ආදර අම්මේ...

බුදු වදනින් ලොව දකින්න
දුක සඟවා සිනාසෙන්න
මා හට කියා දුන්නු
මා ආදර අම්මේ....

දිවි ගමනේ මා තනි කර
ඔබ ගියාම මට නොකියම
දරා ගන්න බෑ මට ඒ දුක
මගේ ආදර අම්මේ....

ඔබ නොමැතිව තාමත් මම
විඳිනා තනිකම පාලුව
පුරවන්නට සමත් කෙනෙක් නැත
මගේ ආදර අම්මේ...

ජීවිතයේ අනියත බව
කාටත් පොදු දහමක් බව
තේරුම් ගත්තෙමි අම්මේ මම
පතනෙමි බුදු බව ඔබ හට
මගේ ආදර අම්මේ....

තිළිණී කුමාරි මාරපන
සේවා අංක 1725
කුරුණෑගල

සුසුමට ලං වී

හුස්ම මා හා ළඟම දැවටී
එකට එක් වී පොර බඳන්
ආ ගමන දැනු නුඹට වෙහෙසද
මදක් නැවතී මට කියන්....

ප්‍රේමයක උණු හුස්මක් දැනුනට
හදේ පතුලෙහි කිමිදෙමින්
හීනියට පපු කුහර පිරිමැද
කොනිත්තුවේ ඇයි දැයි කියන්...

එදා සතුටේදී සිනාසෙන විට
සියලු පිරිවර වටකරන්
ඇත්තමයි නුඹ හුස්ම ගත්තද
අනේ මට අමතක කරමි...

එක පිටට එක වැටී කරදර
සියලු අය මා හැර ගියත්
නුඹම පමණයි ළඟම සිටියේ
එදා සිට අද වනතුරුත්...

අනේ දැන්නම් මටත් වෙහෙසයි
ඉතින් ඇති ආ දුර තවත්
තරහ නැහැ මම වෙහෙස නම් දැන්
හුස්ම ඔහොමම නැවතියන්...

නයනි බණ්ඩාරනායක
සේවා අංක 1193
කුරුණෑගල



ගුරු ගෙදරට 96

අනුපහ අවුරුද්දේ
වප් මහේ පහළොවයි
කොළඹ අහසෙම
යට තිබුණෙ නැව් යෝධයයි
ගුරු පවුර එක් කරපු
සම්පතක උරුමයයි
ඒ තමයි ගුරු ගෙදරෙ
මගෙ මතක ඇරයුමයි...

වට කරන් මහ සයුර
රැළි බිඳපු රටාවයි
නැණ උරුමේ කතාවයි
සමගි බලයෙන් දරා
එක් කරපු වතාවයි
දකුණුදිග ආසියාවට
උරුම සම්පතයි...

නවසියයෙ තිහේදී
ඇරඹුමේ හැරවුමයි
අයිතිකරුවන් පුරා
පතුරවපු කතාවයි
ණයෙන් ණය පොලී කර
එකතුකල වත්කමයි
සියලු දිස්ත්‍රික් පුරා
වත්මනේ පැතිරුමයි...

මහ හුඟක් සවිය දී
ලෝකයක් සරසන්න
හෙටත් අත්වැලක් වෙයි
ගුරු සිතේ රජයන්න
මටත් සවියක් වුනා
ජීවිතේ දිනවන්න
එකම පැතුමක් පතමි
ගුරු ගෙදරට වැජඹෙන්න...

කේ. ඒ. එල්. රත්නායක

අරුන්දතිය නුඹ කොහිද

ගිගුම් දී මහ හඬින්
ඇද වුටුනු අනෝරාව
දෙවනත් කලා
පරිසරය
වැටණු සීතල පින්න
දැනෙයි තවමක් ගතට

බියෙන් තැතිගෙන
ඉගිලුනා සියොතුන්
අහස් කුසට
සැඟවුනා රත්හිරු
අවරගිර කලු වළා අතර
අඳුර රජ වුනා දසත
කලුරෙද්ද පෙරෙව්වා සේ

බියකරුයි දැන් අවට
සිලි සිලි සුලග නෑ
ගස් ගල් සලිත වී
මෙවන් වූ නිමේශයක
හැමදා මා දුටු අරුන්දතිය
නුඹ කොහිද
කියාපන් හඬනගා
නුඹත් අද සැගවිලා ද
මම තවත් සොයමි නුඹ

දීපානි නවරත්න
සේවා අංක 1718
කුරුණෑගල





ආවර්ජනය

කුළුදුල් ආදරය සිහිනය සැබෑ වුනා
රට රකින විරුවෙකු ළඟ සිත රැඳුනා
පෝරුව මත සෙනෙහස දැගිලි බැඳුනා
එකම කැදැල්ලක සෙවනක සුව දැනුනා

මාසෙට දින සතකි නුඹ නිවසට එන්නේ
ඒ ඇවිදින් සිනා සතුට මට දෙන්නේ
ආදරයේ කිරි සිහිනය සැබෑ වුනේ
පුංචි පුතෙකු අපේ ලොවට පැමිණි දිනේ

අහස උසට හීන ගොඩක් සිත රන්දා
ඒ හීනවල සැමදා මම පෙම් බැන්දා
දුටුව එකින් එක සිහිනය ඉටුවන දා
පුංචි පුතුන් හැඩවෙයි නුඹේ රැව කැන්දා

එක වහලක් යට අපේ සිත් හමුවුවා
නුඹ නිවසට එන විට හිරු ගෙන ආවා
යුධ බිය වැද ඒ දවස රට සලිත වුවා
මගේ කුමරු රට වෙනුවෙන් බිලි වුවා

පුංචි පුතුට හිමි වෙද්දි වසර තුනක්
උදා වුනා දෙදහස් නමවෙනි වසරක්
ඇගිලි ගැනත් උන්නෙමි මම දින ගණනක්
උදා වුනා නොදැනිම මට අඳුරු දිනක්

සිහිවන විට සිත සැනසුම නුමේ වදන්
නොඇසේ මට නැවතත් නුඹේ එවැනි වදන්
පුතු සමගින් මා හඬමින් කියූ වදන්
දැස පියා යොමු කෙරුවද එයට සවන්

රට රකින්න ගිය කුමරුනි ආවේ ඉතින්
හතරරියෙන් සැතපීගෙන මිතුරු කරින්
හදේ ගින්න හඬා වැටුනේ මගේ ඇසින්
පුතු සමගින් තනිවුනේ මම මේ විලසින්

අපේ කැදැල්ලෙන් පියඹා ගියපු දුරක්
දහ අට වසරක් ගෙවුනා තනිව මෙතෙක්
අපේ පුතුන් වී ඇත අද ලොකු මිනිසෙක්
වීරිය අරන් ජයගත් මා දිරිය කතක්

කඩා වැටුනා නුඹ ගිය දා සිතින් මෙමා
පුතුන් සමඟ කඳුලැලි සවිකරන් මෙමා
ආවේ දුරක් තනිවම පුතු සමඟ තමා
අපේ පුතුන් රටට වටින රජෙකු තමා

උපන් බිමට ණය නැත නුඹ කිසිම විට
නුඹේ ලෙයින් හැදුන පුතුන් රජෙකි මට
රණ විරුවෙකුගෙ බිරිඳක් වී සිටින්නට
ලැබුන පිනම ඇති එය සතුටකි මට

සුධර්මා විජේසූරිය
සේවා අංක 1570
කුරුණෑගල

මතක අතර රැඳුණු සමුපකාර දිවිය

වසර 37ක සේවා මතකයක නිහඬ සටහනක්ම
දශක තුනකුත් තවත් සත් වසරක්,
කාලයේ පිටු අතර ලියැවුණු කතාවක්...
දහදියෙන්, කැපවීමෙන්, වගකීමෙන්,
ගෙවී ගියේ නොදැනීම ජීවිතයේ වටිනාම කාලයක්...

අධ්‍යාපනයේ හෙට දවස සරසන්නට,
ගුරු පරපුරේ යහපත වෙනුවෙන් කැපවෙන්නට,
සමුපකාරයේ උදාර අරමුණු පෙරදැරිව,
පිය නැඟුවෙමි වසර තිස්හතක් එකම මගක...

අභියෝග හමුවේ නොසැලී සිටි දින,
සතුට කඳුළ පමඟ බෙදාගත් මොහොතවල්,
ජයග්‍රහණ පිටුපස තිබූ සාමූහික ශක්තිය,
අදත් හදවතේ රැව් දෙයි මිහිරි මතකයන් ලෙස...

තනතුරු වෙනස් වුවත් කාලය ගෙවී ගියත්,
මිනිසුන් අතර බැඳුණු සෙනෙහස නොමියෙයි...
එකම අරමුණක් වෙනුවෙන් එක්ව ගිය ගමන,
මගේ දිවියේ අමතක නොවන පරිච්ඡේදයකි...
අද පැමිණ ඇත සමුගැනීමේ මොහොත,
නිල ඇඳුමෙන් නොව මතක වලින් සමුගන්නට...
කාර්යාලයේ දොරටුවෙන් නික්ම ගියත්,
හදවතින් නම් වෙන්විය නොහැක මේ සෙනෙහසින්...

මා හා එක්ව ගමන් කළ සියලු දෙනාට,
දුන් සහයෝගයට කෘතඥ වෙමි හදවතින්...
වැරදුණු තැන පෙන්වා දුන් අයටත්,
දිරි දුන් සැමටත් මගේ ගෞරවය පුද කරමි...

විශ්‍රාමය යනු අවසානයක් නොවේ,
එය තවත් නව ගමනක ආරම්භයකි...
සේවයේ මතක පොත වසා තැබූවද,
එහි සුවඳ සදා කල් මා සමඟ රැඳෙනු ඇත....

සමිතිය මට රැකියාවක් පමණක් නොවීය,
එය මගේ ජීවිතයේ අරුත්බර පරිච්ඡේදයකි...
වසර තිස් හතක සේවා මාවත නිවා කළද,
එහි බැඳීම් හා මතක සදා කල් අමරණීයයි...

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
ඒ. එම්. නිශාන්ත ප්‍රේමලාල්



මගේ සඳ නුඹ

සඳේ නුඹ දන්වද රෑ
මේ ගෙවෙන්නේ
අමාවක දවසක්
සුදුත් නැති කලුත් නැති
අලු පාට දවසක්.....
අමාවක නෑවිදින්
එක ලෙසම උන්නොත්
කෙලෙස එන්නද
පුන් පොහෝදාවක්
ලොවම එළිවන
සිනහා කැන්දන
පුන් පොහෝදාවක්....
අමාරුම අමාවකට
සමු දෙන්න,
බිඳුනු හිත නොවැටෙන්න
දරා ඉන්නම් මම
සඳේ නුඹ ලඟම හිඳ....
සිනාසෙන දිනක් වෙනකම්
නුඹේ හදවත,
පැතුමක් තබා අහසට,
හැකිය කඩා වැටෙන්නට
තරුවක් ලෙස සදහටම
ඒ තරම් ආදරෙයි මම....

හිරුමාලි දිසානායක
ත්‍රිකුණාමලය ශාඛාව

ගුරු ගෙදර

සියවස ලබන්නට තව සිව් වසර ඇතී
මුළු සිරිලකේ ගුරු භවතුන් නිතර එතී
ඒ සැම දෙනාගේ ජීවිත නිබඳ රකී
ගුරු ගෙදරට මිසක් ඒ කල කාට හැකී

කොළොම් පුරේ මැද තේජස් භවන ඇතී
ලක් බිම සතර අත තව සුවිසල් මැදුරු ඇතී
ණය කළඹත් අද බිලියන තිස්දෙකක් ඇතී
සාමාජික පිරිස දින දින ඉහළ යතී

සිරිලක පුරා බැබළෙන මේ මිණි පහණ
දහස් ගණන් සෙත සලසන රන් උයන
රැකගෙන ඉදිරියට ගෙන ආ ඒ සැවොම
හද තුති පුදා සමරමි අපි නිබඳවම

සාගරිකා මනම්පේරි

ඇවිදගිය ගුරු පාර
අදටත් මගබලනවා
ඈත ඉම නිකමට
නුඹ එයිද සිතෙනවා
ගත වෙලෙන වැව් සුළඟ
මතක සිහි කරනවා
ඉරි තැලෙන කන්නෙලත්
රොබරෝසියා පිපෙනවා...

සිතුම් සමීර
ත්‍රීකුණාමලය ශාඛාව





සොහාවික ප්‍රේමය

ඈත ගිරින් කඳු මුදුනින්
වඩිනු හිරු.....
සේද වලා අතරින් රන්
කිරණ යැවූ....
පොළව සිඹින අහසින්
පෙම් ගීය ගැයූ...
පාට වර්ණ දේදුණු පිණි
වැස්ස සැදූ.....
රෝස සුමුදු පෙතිවල මල්
සුවඳ ගැලූ .....
රැට පිච්චි මල්වල විස
බඹරු තුඩු...
සීත සඳෙන් තුරු එලියෙන්
පාර සෙවූ....
කලා මැදිරි යානාවෙන්
ඉගෙල යමු.....

කේ. එච්. චානක රසාංජන
E.P.F. NO -1970
E.D.C.S. - මාතර දිස්ත්‍රික් කාර්යාල

යුවතියකගේ දෛවය

කොඳ මල් පෙති මත
සිහින තැබූ යුවතියකගේ නෙතක,
හෙට දිනක් සොයන විට
දෛවය ලියැවුනේ කඳුලින්ද....

පිය සෙනෙහසෙ උණුසුමෙන්
අම්මාගේ අත අල්ලාගෙන,
ලෝකයම සුන්දර යැයි සිතූ
ඒ ළමාවිය කොහි ගියාද....

කාලය ඇවිද ගිය මාවතේ
මල් නොව කටු මුණගැසුණත්,
බිඳුණු සිහින අතරින පවා
ඇය සිනාසෙන්නට ඉගෙන ගත්තාය.

ඇගේ හදවතේ තැන්පත් කළ
ආදරය, බලාපොරොත්තු, පැතුම්
සමහරක් දෛවය උදුරාගත් නමුත්,
ඇයව කිසිදා ඇයගෙන් උදුරාගත නොහැකි විය.

සඳ එලියට රහසින්
කඳුළු මුසු කළ රාත්‍රීන් තිබුණි,
කිසිවෙකු නොදන්නා වේදනා
ඇගේ නිහඬ සිනහව යට සැඟවුණි.

එහෙත්...
දෛවය ඇය වෙනුවෙන්
කළු අකුරින් ලියූ කතාවක් වුවද,
ඇය තම හදවතින්
එහි අවසානය නැවත ලියන්නීය.

මන්ද
යුවතියකගේ දෛවය
අහසේ ලියූ තරුවක් නොව,
වැටෙන සෑම කඳුලකින්ම
නැවත උපදින ඇගේම ශක්තියය.

ඊ. එම්. සකුණි වරංගනා

ජීවිතය

සුන්දර ලෝකයේ
නිර්මාණය වී ඇති අපි
එකිනෙකාගේ සිත්
අමන්දානන්දයට පත් කරමින්
නොයෙක් දෙයින් පෝෂණය වේ
එනමුදු,
ජීවිතය නමැති වනයේ
කටු පඳුරු සිද දමමින්
ගමන් කරමු පෙරට.
එකනෙකාගේ සිත්
මවිත කරවමින්,
බාධක අභිබවා ගමන් කරමු
අනාගතයේ රන් සළු පැලඳ
දිලෙමු පුංචි තරුවක්ව
නිහතමානි ලෙසින්....

ඩබ්.එම්.පී.සී.ජේ. වීරකෝන්
කාර්යාල කාර්ය සහයක
සේ. අංකය - 2411
මාතලේ දිස්ත්‍රික් කාර්යාලය

අම්මා

ඉරක් මෙන් එලිය දී
සඳක් මෙන් සිසිල දී
ගඟක් මෙන් සෙනෙහෙ දුන්
නුඹයි ඒ අම්මා...

ජීවිතයේ හොඳ නරක
කියා දී හැම විටම
කුඩා කල සිටම
ඔවා දී මා හටම
යවා මා යහමගට
නුඹයි ඒ අම්මා....

නුඹෙන් බිව් කිරි වලට
කිසිම කිසිදාක
බැහැ ගෙවා නිම කරනු
සදා ණය ගැතියි නුඹට
නුඹයි මගේ අම්මා....

ඩී. එම්. පී. කේ. දිසානායක
සේවා අංකය - 2039
මාතලේ දිස්ත්‍රික් කාර්යාලය

එකමුතුකමේ බීජයක් වී

එදා හදවත්වල රෝපණය වූ
ගුරු ගෙදර
පරපුරෙන් පරපුරට සෙවණ දෙන
මහා රුකක් වී අද නැඟී සිටී

ගුරු සිහිනවලට සවියක් වෙමින්
අවැසි මෙහොතේ ලෙන්ගතු අතක් වෙමින්
විශ්වාසයත් මනුස්සකමත් රැකගෙන
අනූහය වසරක් පැමිණි ගමන අභිමානවත්ය...

ඒ මඟ හෙළූ දහඩිය බිඳු
හෙට පිපෙන ජය මල්වල සුවඳයි...

එකට බැඳුණු හදවත්
සියවත සැරසීමේ ශක්තියයි...

2030 වසර උදාවන විට
සියවසේ අභිමන් සරසන්න
අද දකින සුබ සිහින
හෙට සැබෑ කළ හැකි ලෙසින්
ශක්තියක් ගෙන එන්න...

ගුරු ගෙදරට නව පුනරුදයක් රැගෙන ආ
නව අධ්‍යක්ෂ මණ්ඩලය සමඟින්
නැවුම් අදහසින් සිත් සපුරා ගෙන
අත්වැල් බැඳ පෙරට යමු...
ආදරණීය අධ්‍යාපන සමුපකාර සමිතිය.
ඔබේ සියවස සරසන්නේ අප
වසර සියයක මතක පමණක් නොව,
එක්ව සපුරාගත් ඉලක්ක
ජයග්‍රහණවල අභිමානයෙනි

එච්. ඒ. එස්. මදුෂානි
ත්‍රිකුණාමලය

සමු ගමු ඉතින් මේ භවයේ අඳුරු රැයේ

ඉද්ද මලුත් මල් මාලා ගොතාගෙන
සද්ද නොකර සිටිනා බිම බාලගෙන
මන්ද නේන ගමනක් ගියේ සොයුරාණෙන
සිද්ද උණු දේට අපි ඉමු හිත හදාගෙන


රන්දා මතකයේ ගෙවෙනා ඇසිල්ලට
කැන්දා ගෙන ගියා අද මරුවා තුරුල්ලට
අහිමිව ගියේ සෙනෙහස පිරි කැදැල්ල
අනියත සසර ගැන කියමින් සියල්ලට

රැකියාවට කළේ ඔබ පොලිසියේ කාරී
එනමුත් නැහැ කාගෙත් හිත පෑරී
යුතුකම කළා සැමටම මග නෑරී
සැකයක් නැහැ යනවා සසරින් බේරී

මළවුන් අතර තනියම හිඳින්නේ
ඔබේ සහපිරි වර අද තනියට නොඑන්නේ
ප්‍රිය බිරිඳටවත් නැහැ අවසර ලැබෙන්නේ
සොඳුරු නවාතැන අත ඇත හරින්නේ

පහන් පැලේ ඇවිලුණු දැල් නිවීගියේ
ඔබේ තනියට කවුරුත් නැහැනෙ ප්‍රියේ
ආ ගිය තැන් මතකයේ රැඳී තියේ
සමුගමු ඉතින් මේ භවයෙන් අඳුරු රැයේ

පී. එම්. පී. සමන්ති පතිරාජ
සේවා අංකය 1656
කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය



අහස සේ අපි

අහස,
වැහි බීරම
වැටෙන්න ඔන්න මෙන්න
වැහි බිඳුව..
මොහොතත්,
කලුවළා තුතිකර
පායා අවුරැල්ල
ගිගුමු, විදුලි අමතකව...
නිල් අහස,
දවයි පුළුස්සයි හැමතැන්ම

හංගලා කෙහේදෝ වළාකුල...
ඊළඟ මොහොතක,
නිල්පාට කළු කරන්
ඔරවගෙන බලාගෙන
සැනසෙයි සිත් අහස
මහ වැස්සක් විලස...
ඔබත් මමත්
අහසම විලස
නොතේරෙන, වෙනස්වන,
මිනිසුන් වන...

එච්.පී. පියුමි චලනි
EPF - 1769
EDCS - මාතර දිස්ත්‍රික් කාර්යාලය

මලක් වූ ජීවිතය

උදෑසන පිනි වැටී පෙති පුරා
හිරු එළිය වැටුණාම දිලිසෙනා
සුළඟ ඇවිදින් අතු අතර සරා
මල් සුවඳ ගෙන ගියා ලොව පුරා

මල් වුනත් එක පොකුරට හැදුණාට
බුදු පුදට ඕනෑමලු පින් පාට
එකමමුත් රුව, සුවඳ සහ පාට
ගහ සැලකුවෙත් දෙවිදිහටයි ඊට

වැඩෙනකොට ලස්සනට පෙති විදා
නටුව හිණහුනෙත් එය උඩ දදා
රිදුණු පෙති කටුවලින් හිල් හදා
ටිකක් මල් හිටියේම අඬ අඬා

රෑස් ගියත් හිනැහෙනා මල් ලබා
ගස් ගලුත් ඉල්පුණා හිත් නොබා
උස් අසුන් සුමුදු පහසක් ලබා
පන්සලෙත් වකුටු මල් අස් කලා

පිපුණු මල වියළුණත් දවසක
තවත් මලක් පිපෙනවා අත්තක
ලස්සන තියෙන්නේ එක මලක නොව
එකට පිපුණු මල් පොකුරකම බව

නිලා



කෙටි කතාව



සරුංගලය

හිමිදිරියේ ගත වටා එතෙන හීනී සීතලට තව තවත් පොරෝනය තුළට ගුලිවෙමින් නෙත්ම තවත් නිදන්නට සැරසුණි. හිටිගමන් හීනෙන් බය වුනාම මෙන් නැගිට වහා ජනේලය අසළට දිව ගොස් ජනේලය විවර කරන ලදි. සිහිල් සුළඟක් ජනෙල් කවුලුව තුළින් නෙත්මගේ ගතේ වදිමින් කාමරය තුළට ඇතුලු විය. පහුගිය දින දෙක තුන පුරාවටම ඇඳහැලුනු වර්ෂාව අද නැති හැඩකි. අහස හොඳ නිල් පැහැයෙන් බබළන්නට විය. ගස්වල අතු ඉති නෙත්මට අත වනන්නාසේ සුළඟට එහා මෙහා වැනෙන්නටද විය. උදයේම දැකි සුබ දසුනින් ප්‍රීතියට පත් නෙත්මගේ මුවෙහි සුන්දර සිනා හවක් මතු විය.

අද සෙනසුරාදා දිනයක් වූ බැවින් නෙත්මට නිවාඩු දවසකි. හරිම සැහැල්ලු සිතින් පුංචි නෙත්ම කාමරයෙන් පිටතට ගොස් නැවතුනේ බොහෝ සතුටකිනි. පෙර වැහි දිනයන් දෙකෙහි ගෙතුළටම වී සාදා නිම කළ සරුංගලය අද නම් යවන්න පුලුවන් යන ආසාව හිත තුළ පිනුම් ගසනන්න විය.

සීයාගේ උදව්වෙන් කපා දුන් කිතුල් පිත්තට ඉරටු, දේදුනු පැහැයෙන් ඉටිකොළ අලවා නව ජවයක් පිරි සරුංගලයක් බවට පත්වීමට දින දෙකක්ම ගතවෙන්න විය.

පිටුපස වැරන්ඩාවේ කොනක පරිස්සමට තබා තිබූ සරුංගලය අතට ගත් නෙත්ම මිදුලට බැස සැරසුනේ අද දවසේ සැලසුම් ක්‍රියාත්මක කරමිනි.

"පුතා"...

"පුතා"...

තිගැස්සී ගියත් නැසුනා සේ හෙමින් මිදුල හරහා වෙල් යාය දෙසට ඔහු හොර රහසේ පියනගන්නට වුණි.

"පුතා"..

"කොහේද මේ යන්නේ. උදේම පටන්ගත්තද සරුංගලේ අල්ලගෙන.. මෙච්චර කතා කරනවා ඇහෙන්නේ නැද්ද."

"ඇ..ඇයි අම්මා"

"තේ එක මේසේ උඩ තාම. ඇඳන් නැගිටින්නේ සරුංගලේ අල්ලගෙන."

මේ සියලු දේ අම්මා කියන්නේ තමාට නොව වෙන කෙනෙක්ට සේ නැසූ කනින් සරුංගලයේ රැලි එකිනෙක පීරමින් වෙනමම ලොවකය.

"හා... හා.. ඕක පැත්තකට දමලා මූණ හොඳගෙන

තේ එක බීලා ඉක්මනට ලෑස්ති වෙන්න අද තුශාර සර්ගේ පේපර් කිලාස් එකක් 8.ට. ඉක්මනට ලේස්ති වෙන්න. පරක්කු වෙලා තියෙන්නේ."

"අනේ අම්මා අද ක්ලාස් නැනේ. අද සෙනසුරාදනේ. මට බෑ."

හිටි ගමන් අම්මාගේ පෙනුම වෙනස් වෙන්නට විය.

"අනේ අම්මා අද හොඳට හුළඟ තියන්වා. වහින්නෙත් නෑ. මට සරුංගලේ යවන්න හොඳම දවස."

"සරුංගල් යවන්න....

තව දවස් කීයද ශිෂ්‍යත්වෙට තියෙන්නේ. සරුංගල් පස්සේ ගියාම විභාගේ පාස් වෙනවද"

"මට බෑ."

"විභාගේ පාස් උනොත් මට නෙමයි. අපි මේ නොකා නොබී දුක් විදගෙන මහන්සි වෙන්නේ කොහොමහරි උබලට උගන්නන. හොඳ ඉස්කෝලෙකට දාගන්න. කිව්වම අහලා ගිහින් මූණ හෝදා ගන්නවා"

අම්මා අදත් අවුරුදු දෙක තුනක සිට පුරුද්දට කියන වැකිය කියවාගෙන එහෙ මෙහේ බලන්නට විය.

ඒ සොයන්නේ කෝටුවක් බව නෙත්මගේ අත්දැකීමෙන් අවබෝධ වෙන්නට මහ වෙලාවක් නොගිය නිසාවෙන්ම හෙමින් සැරේ සරුංගලය තිබූ තැනම පරිස්සමට තබා ගෙතුළට ගියෙය.

පන්තිය තිබූ උඩුමහල් ගොඩනැගිල්ලේ දැල් ආවරණයෙන් එපිට මුලු අහසම ඔහුට වේදිකාවක් සේ වන්නට වැඩි වේලාවක් ගත නොවුණි. මේ ඇරඹී ඇත්තේ සරුංගල් වසන්තය මිස ශිෂ්‍යත්ව වසන්තය නොවන බව නෙත්මගේ දැනීමයි. එහෙත් එළියෙහි බංකුවක් මත දහසකුත් හීන පොදිගහමින් තම දරුවාගේ අනාගතය සරිකරන්නට, තේ උගුරු දෙක තුනකින් උදේ සිට කුස රවටා සිටින අම්මෙකි. තමන්ට හරි හැටියකට ඉගනීමට අතහිත දීමට නොහැකි වූ තම දෙමාපියන්ට හැකියාවක් නොවුනත්, තම දරුවන්ට කෙසේ හෝ ඉගැන්වීමට මේ අම්මාගේ එකම හීනය වේ. ගමේ පාසලෙන් නගරයේ ජනප්‍රිය පාසලකට ඇතුළත් කිරීම, ශිෂ්‍යාධාර ගැනීමට වඩා ඉස්මතු වී ඇති කාරණාවක් බව මේ අම්මාගේ සිත්හි විය. අනෙක් අතට සිතට නිතර වද දෙන්නා වූ හා වද කරන්නාවූ අසල්වාසී නැදෑ නැනණ්ඩියගේ වචන හරඹයත් දරුවා මත මෙසේ පීඩනය පිටදැමීමට හේතු වන්නට විය.

මේ කිසිත් ගැන කිසිදු බරක්පතළක් නොමැති ඔහු ප්‍රශ්න පත්තරයට උත්තර ලියමින් සිටී. එහෙත් නිතර ඔහුගේ දෙනෙත් දැල් ආවරණයෙන් එපිටට ඇදී යන්නේ නොදැනුවත්වම වේ. මේ ගැන අවධානයෙන් සිටි පුද්ගලයා පැමිණ,

"පුතා"

"සර්"

"ඔයා පේපර් එක ලියලා ඉවරද?"

"නෑ සර්, මං තාම ලියනවා."

"එහෙනම් සැරින් සැරේ අහස දිහා බලන්නේ."

"නෑ."

"මං දැක්කනේ දැන් කීප සැරයක් එහේ බලනවා."

"නෑ සර්, මං ඒ ප්‍රශ්න වලට උත්තර මතක් කරනවා."

කට කොනට සිනහවක් නැගි ගුරුතුමාට දැලෙන් එපිට අහස මත ලෙලෙනා සරුංගල් දැක ගත හැකි විය

"හා හා වෙලාව ඉවර වෙන්න කලින් ලියන්නකෝ එහෙනම්."

යැයි පවසා හිස අතගා යන්නට හැරුනේය.

පසුදා පාසල් නිමවී නිවසට පැමිණෙනන අතරමගදී නොවැටී නෙත්ම බේරුණේ අම්මා නිසාය.

"මොන සිහියකින්ද ළමයෝ පාරෙ යන්නේ. උඩ බලාගත්ත ගමන්මයි. පාර බලාගෙන යන්න බැරිද"" අම්මේ අම්මලා පුංචි කාලේ සරුංගල් යවලා තියනවද""නෑ."

"ඒ මොකද?"

"මාමලානම් ඉස්සර සරුංහල් හදලා වෙලේ ඉදන් යැව්වා"

"අම්මා ශිෂ්‍යත්වේ පාස්ද..."

"ශිෂ්‍යත්වේ පාස් උනානම් මං මෙහෙම ඉදීවිද ළමයෝ. එහෙනම් අපිත් හොඳ ඉස්කොලෙකට ගිහින් හොඳට ඉගනගෙන දොස්තර කෙනෙක්, ඉංජිනේරුවෙක්, ගුරුවරයෙක් වෙන්න තිබුනා"

අහසේ තිබූ දැස් දැන් අම්මා මතය. ඔහුට අම්මා ගැන සිහින් දුකක් දැනෙන්නට වුණි.

"එහෙම උනානම් ඔයායි මමයි දැන් ඉස්කෝලේ ඇරිලා යන්නේ වාහනේකින් නේ, මෙහෙම පයින් නෙමෙයි නේ."

"එහෙම උනා නම් අපිට කඩේ විකුණන්න තියන නයා සරුංගලයක් ගන්නත් තිබුනා නේ අම්මේ."

"හ්ම්ම්ම්ම්ම....."

තම දරුවා ගැන දැනුනු සෙනේ පිරි අනුකම්පාවත්, තමන් ගැන දැනුනු සංතාපයෙනුත් යුතුව පුංචි පුතුගේ දැත තම සුරතට ඕ ගුලිකරගත්තාය.

"නංගියේ....."

"කෝ පුතේ අම්මා"

නිවෙස ඉදිරිපිට වෙල් නියරේ සරුංගලය යවමින් සිටි නෙත්මගෙන් ඇ විමසීය.

"ගෙදර නැන්දේ..."

"ඒ කොලුවෝ හෙට අනිද්දා විභාගෙට ලියන්නේ සරුංගල් යැව්වා කියලද?"

ඈ ඔලොක්කුවට අසමින් ගේ දෙසට පියමැන්නාය.

"ඒ නංගියේ මේ සතියේ නේ විභාගේ. අර ළමයා අර සරුංගල් යවන්නේ. ඒකත් තාම ඉස්කෝලේ ඇඳන් ගිය කලිසම පිටින්ම."

"ඔය දැන් ටිකකට කලින් ආවේ. ඉස්කෝලෙත් හවස පන්ති තියනවා මේ ටිකේම. ටිකක් ඉතිං ඔන්න ඔය නිදහසක් තියෙන්නත් එපාය."

"හරි ශෝක් අම්මම ඔහොම කියනකොට දරුවා



ඔහොම නොවී තියේවිද? නිදහසේ ඉන්න බැරුවය විභාගේ ඉවරවෙලා."

අම්මා කිසිත් නොකියා තාත්තා, ආච්චි අම්මා, සීයා දෙස බැලුවාය.

"මොකෝ දුවේ මේ හැන්දෑවේ මේ පැත්තේ" ඒ ආච්චි අම්මාය.

"නෑ... මං මේ අර දරුවා පාඩමක් කරන්නේ නැතුව සරුංගල් පස්සේ දුවනවා දැකලා මේ ආවේ. ඔහොම හරියන්නේ නෑ. දරුවා ටිකක් පාඩම් වැඩ වලට උනන්දු කරවන්න කියන්න"

"හ්ම්ම්ම්ම්, මේ ළමයට බීල යන්න තේ ටිකක් හැදුවනං ඕන නෑ මාමේ. මං ගිහින් එන්නම් එහෙනම්."

"හා හොඳයි හොඳයි."

පාසලේ අවසන් දවස. විභගය හේතුවෙන් දෙමාපියන් කැඳවා රැස්වීමක් පවත්වන්නට යෙදුනේය.

පන්තිහර ගුරුතුමියගේ ඇතුළු අනෙකුත් ගුරුවරුන්ගේ ආශිර්වාදය හා සුබ පැතුම් දරුවන්ට ලැබුනි.

පන්තිහාර ගුරුතුමිය නෙත්ම අමතා,

"ඔයාට හොඳට ශිෂ්‍යත්වෙ පාස්වෙන්න පුලුවන්. ඔයා හොඳ දක්ෂ දරුවෙක්. මම ඔයාට සුබ පතනවා පුතා."

ඔහු ගුරුවරියට වැඳ අසිරි ලබාගන්නා ලදි.

හෙට දිනයේ මුහුන දීමට ඇති ශිෂ්‍යත්ව විභගය හේතුවෙන් පන්සලේ පැවැත්වෙන බෝධි පූජා පිංකමට සහභාගී වූ නෙත්ම නිවසට පැමිණියේ, හෙට ඇති විභාගයට සූදානම් වීමට නොවේ. ඔහුට අවශ්‍යව ඇත්තේ සරුංගලය යැවීමේ අදහසයි. එහෙත් අම්මාගේ සිතෙහි නම් තරමක සැහැල්ලු බවක් දැනෙමින් තිබුනි. ඒ සැහැල්ලු බව නිසාවෙන්ම වෙනදාට නෙත්මට දමන ගෝරනාඩුව වෙනුවට,

"වැඩි වෙලා බෑ.. ඉක්මනට එන්න ඕන"

"හරි අම්මේ..."

යැයි පැවසුවේත් සරුංගලය රැගෙන දුවන අතරේය.

බොහෝ සතුටින් නූල් පන්දුවේ නූල් දෙමින් ඇත. අහසේ කෙමෙන් ප්‍රමාණයෙන් කුඩා වෙමින් පාවෙනා සරුංගලය සේ පුංචි කොල්ලාගේද හිතද සැහැල්ලුවෙන් පාවෙමින් පැවතිණි...

අසල්වාසී කුසුම නැන්දා ඔය අතරේ නිවෙසට පියමනිනා බවක් ඔහුට දැනීමක් නොවීය.

"ඒ නංගියේ අර ළමයා අදත් වෙලේ සරුංගලේ පස්සේ නේද?"

"ඔහොම ටිකක් නිදහසේ ඉදපුදෙන් අනේ."

ඒ අතරේ අම්මා පුතේ දැන් ඇති නේ එන්න යැයි අඬගැවාය.

"අපේ ළමයි නං ඔහොම නෑ. ඉගෙන ගන්න එකේ, දෙමව්පියන්ගේ මහන්සිය, බලාපොරොත්තු ගැන තේරෙනවා."

"පුතා, දැන් ඇති. මෙහෙ එනවා."

එවර නම් අම්මාගේ හඬෙහි සැර වැඩි බව නෙත්මට දැනුනේය.

"තව ඩිංගක් අම්මේ"

"දැන් බලන්න මේ ළමයි. කතා කරාට ආවද. නිකංවත් මේ කතා කරෙ කවුද කියලවත් බැලුවද..."

"පුතා දැන් එනවද නැද්ද. මං ඇවිල්ලා ඔය සරුංගලේ නූල කපලා දාන්නද."

අම්මාගේ සිතේ පීඩනය තව තවත් වැඩි කරමින් අසල්වාසියා සිත කලඹවන්නට විය.

"මං වගේ නම් නංගියේ බල බල ඉන්නේ නෑ. දෙකක් දීලා මෙලහකට. ඔහොම හුරතල් කරලා හරියන්නේ නෑ. වෙලාවට ඔහොම කියන දේ අහන්නේ නැති ළමයි අපේ ගෙදර නෑ."

අම්මාගේ ඇඟේ ලේ රත් වෙමින් කේන්තිය ඉස්මතු වුවත්, එය අසල්වාසියාගෙන් පිට නොවී වෙනකෙක් මතින් යන්නට අරාදිමින් පවතී.

කුස්සියේ මේසය මත වූ අතට අසු වූ මේස පිහිය ගෙන ඕ වෙල් යාය දෙසට යන්නට විය. හිතේ කේන්තියත් සමඟ මුසු වූ ගමන් වේගය වැඩි වෙත්ම, ඈත අහසේ ප්‍රමාණයෙන් කුඩා වී ලෙලදෙමින් පැවති සරුංගලයේ ගැටලූ නූල මෙහා කෙලවරින් කැපී යන්නට විය.

තම පාලනයෙන් ගිලිහුණු සරුංගලය අහසේ ඉබාගාතයේ එහා මෙහා පාවී ඈතට යන්නට විය.

සිදු වූ දෙය ගැන හිටි හැටියේ කිසිත් සිතා ගත නොහැකි වූ නෙත්ම විශ්මයෙන් යුතුව බලා සිටියේය. එකවරම මහා හයියෙන් නෙත්ම කෑගසා අඬන්නට විය. ඒ සමඟම අම්මාගේ හදිසි ක්‍රියාවෙන් කළ දෙය අවබෝධ වීමෙන් අම්මාටද ඇඬුම් වළකා ගන්නට නොහැකි විය.

★ ★ ★ ★ ★ ★

හිමිදිරියේ අලුත් දවසකට ආලෝකය දෙමින් හිරු නැගෙනහිරි පායා එයි.

කුස්සියෙන් කිරි බතක් ඉදෙනා සුවඳ පුංචි නෙත්මගේ නාස් පුඩු තුළට දැනෙන්නට විය. ඊයේ සන්ධ්‍යාවේ සිදු වූ හිත් රිදවූ කාරණය තවත් මතක් නොකොට ඔහු අද දවසේ අභියෝගයට මුහුණදීමට සූදානම් වූවේය.

තෙරුවන් නැමඳ, ගෙදර සියලු දෙනාගෙන්ද වැඳ ආශිර්වාද ලබා සතුටු සිතින් යුතුව අම්මා හා තාත්තා සමඟින් පාසලට යාමට පිටත් විය.

වෙනදා පාසලේ නොමැති නුහුරු නුපුරුදු බවක් පුංචි නෙත්ම වටා එතෙන්නට වූවේය. නැතත් තාත්තාටත් අම්මාටත් වැඳ ආසිරි ලබාගත් නෙත්ම

"මං ශිෂ්‍යත්වේ පාස් වෙන්නම් අම්මේ" යැයි මවට පවසා යන්නට සැරසුනි. අම්මාගේ දැස් මත දිලිසුනු කඳුලු බිඳු කුඩා දරුවාගේ සිතෙහි ඇඳීගියේය.

යුහුසුලුව ගුරුවරියක විසින් ප්‍රශ්න පත්තර බෙදීමත් දරුවන් උත්තර ලිවීමත් ආරම්භ වී කාලය කෙමෙන් කෙමෙන් ගත වෙන්න විය. විභාගය අවසන් බවට හැඟවෙන සීනුව නාද වීමත් සමඟ පිළිතුරු පත් ලබාදී සැහැල්ලු සිතින් දරුවන් දුව යති.

අද සිට ඕනෑ තරම් සෙල්ලම් කිරීමට හැකිය. පන්ති යන්න, ප්‍රශ්න පත්තරවලට පිළිතුරු ලියන්ට අවැසි නොවනා බව සතුටු සිතින් එකිනෙකා සමඟ දොඩමලු වෙයි. දෙමව්පියන්ගේද සිත්වල වූ බර සැහැල්ලු වූවා මෙන් ඔවුනොවුන්ගේ මුහුණුවලින් පිළිබිඹු වේ.

ඒ ගෙවෙන්නා වූ කාලය මාසයක පමණ සිට නෙත්ම සිටියේම යහලුවන් සමඟ සෙල්ලමිනි. විටෙක ක්‍රිකට් සෙල්ලම්, හැංගිමුත්තන් ගැසීම, බයිසිකල් පැදීම ආදී නොයෙක් කෙලි සෙල්ලම්වලින් ගත වූවේය. එහෙත් ඔහුට සරුංගලක් සාදා සරුංගලයක් යැවීමට අදහසක් නොවීය. නිවැසියන්ටද නොවිමසුවාට එය ගැටලුවක්ව පැවතියේය.

පෙර දින රාත්‍රී පුවත් විකාශයේදී පැවසූ ආකාරය අද දින ශිෂ්‍යත්ව ප්‍රතිඵල නිකුත් වීමට නියමිතය. එය නැවත වරක් දැනුවත් කිරීමට අසල්වාසී කුසුමා නැන්දා උදයේම පැමිණ කීවාය.

අම්මා නම් සිටියේ සිතේ නොසන්සුන් කමිනි. නෙත්මට නම් ඒ බව එතරම් දැනුනු බවක් නම් නොවීය.

හවස දෙකට පමණ තාත්තා හදිසියේම ගෙදර පැමිණියේය.

"ශිෂ්‍යත්වේ ප්‍රතිඵල නිකුත් කරලා. කෝ දරුවගේ විභාගේ අංකේ දෙන්න ඉක්මනට..."

අම්මා වහා දුව විත් ඩයරියක් පෙරලා අංකයක් තාත්තාට කීවාය. ඒ විභාග අංකය බව නෙත්මට මතකයේ තිබේ.

නිවැසියන් සියලු දෙනා තාත්තා වටේ එක් රොක්වෙන්නට විය. නෙත්මත් හෙමින් එදෙසට ඇදී යන්නට විය.

එකවර පැමිණි අම්මා ඔහු බදාගෙන අඬන්නට විය. ඒ ඇඬුමෙන් නෙත්මට වැටහී ගියේ තමා ශිෂ්‍යත්වය අසමත් වී ඇති බවයි.

"මගේ පුතේ පුතා හොඳටම විභාගේ පාස් වෙලා" යැයි පවසා අඬමින් අම්මා පුංචි පුතු වඩා ගත්තාය.

"මගේ පුතාට මොනවද ශිෂ්‍යත්වේ පාස් උනාට ඕන.""සරුංගලයක්"

අම්මා නැවත දරුවා බදා හඬන්නට වූවාය.

පියුමි වලනි ගමගේ

-EDCS මාතර දිස්ත්‍රික් කාර්යාලය

வரலாற்று வித்தும் வளர்ந்த ஆலமரமும்

ஆயிரத்து தொண்ணூற்று முப்பதிலே வித்திட்ட நல்ல விதை,
அன்று விதைக்கப்பட்ட ஆழமான நம்பிக்கையின் பெருமுனைப்பு!
நூறாண்டை நெருங்கிடும் நற்பயணத்தின் நற்சுவடுடன்,
இன்று பல்கிப் பெருகி ஆலமரமாய் நிமிர்ந்து நிற்குது இன்று வரை!

கல்வி நிலத்தின் அடிவேராய்த் திகழும் ஊழியர் கூட்டத்திற்கு,
காலமெல்லாம் நிழல் தரும் கற்பகத்தருவாய் உருவெடுத்தது!
எண்ணற்ற புயல்களையும் சோதனைகளையும் கடந்து நின்று,
எண்ணிய காரியம் யாவும் முடிக்கும் ஆற்றலாய் நின்றது!



ஆசிரியர் சமுதாயத்தின் பேராதரவு

ஆசிரியரின் நல்வாழ்வுக்காய் அமைந்த உறுதியான நல்வாழ்க்கைப் பாதை,
கல்விச் சேவை ஊழியரின் கரம்பிடித்த நெஞ்சார்ந்த நற்போதை!

கற்பிக்கும் கரங்களுக்குக் கனிவோடு துணையாகி,
கற்பகச் சோலையாய் அவர் வாழ்வை மலரச் செய்த தாரக மந்திரம்!

அறிவொளி வீசும் ஆசிரியப் பெருமக்களின் வாழ்வியலில்,
அன்றாடத் தேவைகளை நிறைவேற்றும் அன்பின் புகலிடம்!

அடிமைத்தனப் பொருளாதார இருளை அகற்றி,
அறிவார்த்தமான நிதி நிர்வாகத்தின் வழிகாட்டி!

ஸ்ரீசேமிப்பும் சிக்கனமும் தந்த பாடம்

சேமிப்பின் மேன்மையைச் செப்பியே அழகாய் அமைந்தது,
சிக்கனத்தின் உயர்வினைச் சிந்தைக்கே ஆழமாய்த் தந்தது!

சிறுகச் சிறுகச் சேமிக்கும் நற்பண்பினை விதைத்து,
பெரு வெள்ளமெனப் பெருக்கம் காணும் வாழ்வை அமைத்தது!

ஆடம்பரச் செலவுகளைத் தவிர்த்து நல்வழியைக் காட்டி,
ஆக்கப்பூர்வமான எதிர்காலத்திற்கு அஸ்திவாரம் அமைத்து,
குடும்பத்தின் முன்னேற்றத்திற்கு முதன்மைச் சக்தியாய்,
ஒவ்வொரு வீட்டிலும் சேமிப்பு விளக்கை ஏற்றி வைத்தது!

கரம்பற்றும் கடனுதவியும் பாரம் இறக்குதலும்

தேவைப்படும் வேளையில் கரம்பற்றித் தாராளமாகக் கடனுதவி அளித்தது,
ஆசிரியப் பெருமக்களின் ஆயிரம் பாரங்களை எளிதாய் இறக்கியது!

பிள்ளைகளின் உயர்கல்வி, சொந்த மனை, திருமணச் செலவு என,
திடீரென வரும் நிதிச் சுமையை நைசாய் லேசாக்கியது!

கந்து வட்டியின் பிடியில் சிக்காமல் காத்து நின்ற கவசம்,
கண்முன்னே நிழலாடும் உண்மையான ஆபத்பாந்தவன்!

தயக்கமின்றி வாசல் தேடி ஓடிவரும் கனிவான கரம்,
துயரத்தின் தருணங்களில் ஆறுதல் தரும் அன்பு நிழல்!

ஒளிரும் குடும்பங்களும் தொடரும் பந்தமும்


ஆயிரம் ஆயிரம் குடும்பங்களின் ஒளிமயமான நல்வாழ்வு
அனைத்துத் துறை ஊழியர்களின் இல்லங்களிலும் நிறைந்த மகிழ்ச்சி!

நெருக்கடி வந்தபோதெல்லாம் முதல் ஆளாய் ஓடிவந்திட்ட சொந்தம்,
கல்விச் சேவையாளர்களின் என்றென்றும் தொடரும் நம்பிக்கைப் பந்தம்!

நம்பிக்கை விதைத்து நன்மையைப் பலவாறாய்ப் பெருக்கி,
நாளுக்கு நாள் வளர்பிறையாய் வாழியவே நுனுஊளு சங்கம்!

கல்வி உலகம் போற்றும் காக்கும் அற்புதக் கவசமாய்,
என்றும் தடையின்றித் தொடரட்டும் இந்த உன்னத சேவை!

ஞா. சுகிர்தவாணி
நம்பிக்கையின் நிழல்: EDCS - 1930
வவுனியாகிளை



වැඩවසම් සමුපකාරයට ආයුබෝවන් කියමු

ලංකාවේ සමුපකාරය යනු බඩු බෙදන හෝ විකුණන කඩයක් හෝ වෙළෙඳ ආයතනයක් නොවේ. එය රටේ ග්‍රාමීය ආර්ථිකයේ හෘද ස්පන්දනයයි කීවොත් වඩා නිවැරදිය. බ්‍රිතාන්‍ය පාලන සමයේදී ණය බරින් මිරිකී සිටි ලාංකික ගොවියා මුදලාලිගේ ණය උගුලෙන් ගලවා ගැනීමට 1906 දී පමණ ණය සමිති ලෙස ආරම්භ වූ සමුපකාර ව්‍යාපාරය අද වන විට බහුකාර්ය සමුපකාර සමිති, සමුපකාර බැංකු, රක්ෂණ, කර්මාන්ත, ධීවර, සෞඛ්‍ය හා නිෂ්පාදන යන ක්ෂේත්‍ර දක්වා ව්‍යාප්ත වී ඇත. මේ සියලු ක්ෂේත්‍ර කෙරෙහි ඇත්තේ එක් අරමුණකි, ඒ සාමාජිකයාගේ ජීවන තත්වය උසස් කර ගැනීම මිස ලාභය උපරිම කර ගැනීම නොවේ.

නමුත් අද වන වි ඒ උත්කෘෂ්ඨ අරමුණ ගිලිහී ගොස් ඇත්දැයි සැක සිතිය යුතු තැන් නැතුවාමද නොවේ. පාරිභෝගිකයා සමුපකාරයට එන්නේ අයිතිකරුවෙකු ලෙස නොව, යාචකයෙකු ලෙස යන හැඟීමක් බොහෝ සමුපකාර ආයතන තුළ දක්නට ලැබේ. එවැනි හැඟීමක් ඇති වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ සමුපකාර සේවය තුළ තවමත් නොනැසි පවතින සාම්ප්‍රදායික වැඩවසම් මානසිකත්වය විය යුතුය.

වැඩවසම් මනෝභාවය යනු කුමක්ද?

වැඩ වසම් ක්‍රමයේදී සේවකයා යනු හාම්පුතාට සේවය කරන, ප්‍රශ්න නොකරන, තීරණ ගැනීමට දායක නොවන පුද්ගලයෙකි. ලංකාවේ සමුපකාර ව්‍යාපාරය විවිධ කෂේත්‍ර ඔස්සේ සේවා සපයන ආයතන නඩත්තු කරන අතර, එම සේවාවන් වල මෙම වැඩවසම් මනෝභාවය ආකාර තුනකින් දැකිය හැකිය.

පළමුව - නිලධාරිවාදී මනෝභාවය

සමහර සේවකයින් සිතන්නේ තමන් රජයේ නිලධාරියෙකු බවයි. පැමිණි පාරිභෝගිකයා නොදුටු සේ කටයුතු කිරීම, ගොනු පරීක්ෂා කරමින් සිටීම, අත්සන් දැමීම ප්‍රමාද කිරීම, හෙට එන්න, පොඩ්ඩක් ඉන්න, පස්සේ එන්න, යැයි පැවසීම සාමාන්‍ය දෙයකි. තමන් මැදිහත්කරුවා නොව නිලධාරියා ලෙස සිතීම මෙහි මූලයි.

දෙවනුව - දේශපාලන වහල්භාවය

ලංකාවේ බොහෝ සමුපකාර සමිති අතීතයේ සිටම දේශපාලනීකරණය වී ඇත. ඒවායෙහි පාලකයා වෙනස් වන විට සේවකයාගේ පක්ෂපාතීත්වයද



වෙනස් වේ. වෘත්තීය අරමුණු පසෙකලා දේශපාලන අරමුණු මුදුන්පමුණුවා ගැනීමට කටයුතු කරයි. තම රැකියාව සුරක්ෂිත කර ගැනීම උදෙසා දේශපාලන ලොක්කන්ගේ අත අල්ලා ගැනීම, කුසලතාවයට වඩා කීකරුකම අගය කිරීම, වැනි දේ මෙහි දැකිය හැකි ලක්ෂණයි.

තෙවැන්න - සේවා ලාභියා කොන් කිරීම

සමුපකාරයක සැබෑ හිමිකරු සාමාජික ගොවියා, ධීවරයා, වෘත්තිකයා, කම්කරුවා, කාන්තාවයි. නමුත් සැබෑ සාමාජිකයා ඉදිරිපිටදී ද සේවකයා සිතන්නේ තමන් හාමුපුතා බවයි. අයිතිකරුවා බවයි. පාරිභෝගිකයාට, සේවා ලාභියාට නිවැරදි තොරතුරු නොදීම, නිවැරදි යොමු නොකිරීම, තත්ත්වයෙන් පහළ භාණ්ඩ අලෙවිය, පහත් වචන භාවිතය, මෙම වැඩවසම් ආකල්පයේ ප්‍රතිඵලයන්ය.

මේ නිසා සමුපකාරයට අත්වී ඇති ඉරණම කුමක්ද?

පෞද්ගලික සුපිරි වෙළෙඳසැල් සමග, පෞද්ගලික රෝහල් සමග, පෞද්ගලික ඉන්ධන හල් සමග, පෞද්ගලික ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සමග හා අනීතික

මූල්‍ය ආයතන සමග තරග කිරීමට නොහැකිව සමුපකාරය දැඩි පසු බෑමකට ලක් වී තිබීමයි. එමෙන්ම නූතන තාරුණ්‍ය විසින් සමුපකාරය හා එහි සේවාවන් ප්‍රතික්ෂේප කරමින් ඉන් දුරස්ථ වීමයි. කාර්යක්ෂම බව, ඵලදායීත්වය හා ගුණත්වයේ දුර්වලකම නිසා අනාගතයේ භාරකරුවන් සමුපකාරය කෙරෙහි විශ්වාසය නොතබන තැනට තල්ලු වී තිබීමයි.

එසේ නම් අප දැන් කල යුතුව ඇත්තේ කුමන විදිහක ආකල්ප සංවර්ධනයක්ද?

වැඩ වසම් සේවකයාගේ සිට නූතන නවීන සමුපකාර වෘත්තිකයා දක්වා මේ ව්‍යාපාරයේ සේවක ආකල්ප හා භාවිතයන් වෙනස් කල යුතුව ඇත. ඇත්ත වශයෙන්ම සමහර සේවකයින් අංශක 180 ක්ම හැරවිය යුතුව ඇත.

සමුපකාර සේවකයා අයිතිකරුවන්ගේ සිට සේවකයා දක්වා නොව සේවකයාගේ සිට අයිතිකරු දක්වා හඳුනාගත යුතුය. මෙහි තේරුම්ගත යුතු දෙය නම් ව්‍යාපාරයේ අයිතිකරු සාමාජිකයා බවයි. අයිතිකරුවන් ව්‍යාපාරයෙන් ඉවත් වුවහොත් එහි සමුපකාරයක් ඉතිරි වන්නේ නැත. එවිට ඉතිරි වන්නේ කීප දෙනෙකුගේ හෝ එක් අයෙකුගේ ව්‍යාපාරයකි. එදිනට එහි තීරණ ගන්නේ ව්‍යාපාරයේ ලාභය පදනම්ව මිස සමුපකාරයක් ලෙස සේවකයාත් ඇතුළු පොදු අර්ථයෙන් නොව රජයෙන් හෝ දේශපාලඥයෙකු පඩි නොගෙවන සමුපකාරය ඉන් පසු පොදු ලාභයකින් වැටුප් වෙන් කරයි. එසේ නම් ගනුදෙනුකරුවාත් සාමාජිකයාත් රැකගත යුතුයි. ඒ Customer is King අර්ථයෙන් නොව Customer is Owner අදහසිනි.

සමුපකාරයේ රැකියාවෙන් ඔබ්බට වූ මෙහෙවරක් ඇත. සමුපකාර සේවය යනු අට - හතර රැකියාවක් පමණක් නොව එහි මෙහෙවරක් හා වගකීමක්ද පැවරී ඇත. තම ගමේ ගොවියාට හොඳ බීජ ටිකත් ලබා දීමෙන්, ගැබිණි මවට පිරිසිදු කිරි වීදුරුවක් ලබා දීමෙන්, ගුරුවරයාගේ ශිෂ්‍යත්වය සමත් දරුවාට අදාල ප්‍රතිලාභය ලබා දීමෙන්, සාමාජිකයාට තැන්පතු මුදලට නිවැරදි පොලිය ලබා දීමෙන් ණයකරුවෙකු සේ නොසලකා ඔහු සමීප පාරිභෝගිකයා සේ සැලකීමෙන් විඳියහැකි ආත්ම තෘප්තිය ගැනද සිතා බැලිය යුතුය. තමන් කැමති දේ ලැබීමෙන් තමා සතුටට පත් වන්නා සේම ගනුදෙනුකරුට හොඳම දේ ලබා දීමට අප සමත් විය යුතුය. පුහුණුව විසින් කරන මග පෙන්වීම මෙන්ම ආදර්ශයද ජීවිතය තුළ ප්‍රගුණ කිරීමෙන් මේ ආත්ම තෘප්තිය ජීවිතයට එක් කර ගත හැකිය.

දැනුම හා තාක්ෂණයට විවෘත වීම ලාච්චුවේ ඇති පොත බලා ගනුදෙනු කිරීම වෙනුවට නවීන තාක්ෂණයට එකතු වීමට සේවකයා වගබලා ගත යුතුය. ජංගම දුරකථනයෙන් මිල හා භාණ්ඩ සොයා යන පාරිභෝගිකයා අසල අප තවමත් ලෙජරයට යට වී විවෘත ආර්ථිකයේ තරගකාරී වෙළෙඳපොළ අත්පත් කර ගත නොහැක. වත්මන් ගනුදෙනු කරුවා සොයා යාමේදී නවීන තාක්ෂණික මෙවලම් භාවිතය අත්‍යවශ්‍ය කරුණකි. Pos යන්ත්‍ර, Digital ගිණුම්කරණය, සමාජ මාධ්‍ය අලෙවිකරණය පිළිබඳ දැනුම අත්‍යාවශ්‍ය කරුණකි.

නවීනත්වයට හුරු වීමේදී, අපි කාලයක් තිස්සේ කළේ මෙහෙමයි, යන මානසිකත්වයෙන් මිදිය යුතුය. වගවීම හා විනිවිදභාවය වැඩ වසම් ක්‍රමයේදී ප්‍රශ්න කිරීම තහනම්ය. එසේ නම් වැඩවසම් මානසිකත්වයෙන් මිදීමට මුලින්ම කළ යුතු වන්නේ සේවකයා තම සේවාවට වගකිව යුතු පුද්ගලයෙකු වීමයි. දිනපතා පාඩු, ලාභ, පැමිණීලි පිළිබඳ විවෘතව කථා කරන සංස්කෘතියක් මෙන්ම, අනෙකාට ඇහුම්කන් දෙන, ගැටළුවලට ප්‍රතිචාර සපයන වගවීම හා වගකීමත් පොරොන්දු ඉටු කිරීමත් ප්‍රගුණ කළ යුතුය.

මේ සියලු දේ ඉටු වීමට ප්‍රායෝගික පියවර කිහිපයකි. එනම් බඳවා ගැනීමේදී සහ උසස් වීම් ලබා දීමේදී දේශපාලන නිර්දේශ නොව, ආකල්ප, කුසලතා, මෙන්ම පාරිභෝගික ආකල්පයන්ද සැලකිල්ලට ගෙන කටයුතු කිරීම, වැනි සංස්කෘතියක් ගොඩ නැගිය යුතුය. සෑම වසරකම, ආකල්ප සංවර්ධනය, සන්නිවේදනය හා තාක්ෂණික පුහුණු වීම්, පාරිභෝගික සන්නිවේදන කුසලතා දියුණු කිරීම සඳහා කටයුතු සැලසිය යුතුය. තවද සාමාජික ඇගයීම් සැලකිල්ලට ගනිමින් සේවක ඇගයීම් සිදු කිරීම මූල්‍ය හා මානසික තෘප්තිය ඇති වන ඇගයීම් සිදු කිරීම වැනි ක්‍රමවේද භාවිතා කළ යුතුය.

සමුපකාරය යනු මේ රටේ දුප්පත් මිනිසාට නැගී සිටීමට ඇති අවසාන ආර්ථික බලකොටුවයි. එම සුවිශේෂී බලකොටුව ඇතුළත සිටින සේවකයා තව දුරටත් වැඩවසම් හීන දකින්නේ නම් ආර්ථික පවුරු බිඳ වැටීමට වැඩිකල් නොයනු ඇත. එබැවින් තාක්ෂණය අවශ්‍ය වුවද ඊටත් පෙර ගොඩනැගිය යුත්තේ මිනිස් ආකල්පයි. ඉදි කරන ගොඩනැගිලි වලට පෙර ආයෝජනය කළ යුත්තේ මානව සම්පත සංවර්ධනය සඳහාත් ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය සඳහාත්ය. සාම්ප්‍රදායක වැඩවසම් සේවකයා වෙනුවට සිනහවත්, ගෞරවයත්, වගකීමත් පෙරදැරිව කටයුතු කරන වෘත්තිකයෙකු බිහි කිරීම තුළින් අප හමුවේ ඇති ආර්ථික සමාජ හා ව්‍යාපාර අභියෝග ජය ගැනීමට අපට හැකි වනු ඇත. ඒ සඳහා දැඩි විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම අප සැමගේ අභියෝගාත්මක වගකීම බව තේරුම් ගනිමු.

එස්. එන්. දිල්ශාන් ප්‍රසන්න කුමාර

කළමනාකරු
අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය - අනුරාධපුර





නිහඬ අටවැනි තට්ටුව

කොළඹ නගරයේ කාර්යබහුල පරිසරයක සක්‍රිය වන Global ආයතනයේ අටවැනි තට්ටුව, රාත්‍රී 8.00න් පසු වෙනම ලෝකයක් බවට පත් වේ. වසර පහකට පෙර සිදු වූ අභිරහස් අතුරුදහන් වීමක් සහ එහි පිටුපස සැඟවුණු සත්‍යය සොයා යන තරුණ යුවළකගේ ත්‍රාසජනක කතාන්දරය.

කොළඹ නගරයේ අහස උසට නැඟී සිටින Global ගොඩනැගිල්ලේ අට වැනි තට්ටුවේ වායුසමීකරණ යන්ත්‍රවල නැගෙන සිහින් හඬ හැරුණු විට මුළු මහලම පැවැතියේ පාළු නිහඬතාවකය. පරිගණක තිරයේ ආලෝකය හමුවේ කවීන්ගේ දෑස් වෙහෙසට පත්ව තිබුණි. වෙලාව රාත්‍රී 8.00 පසුවී මිනිත්තු පහකි. කවීන් කෝපි කෝප්පයක් සාදා ගැනීම සඳහා Pentry එක දෙසට පියනැගුවේය. ඒ සමගම, හිස් කොරිඩෝව දිගේ බර අඩි සද්දයක් ඇසුණි. "කවුද ඒ?" කවීන් ආපසු හැරී බැලුවද කිසිවෙකුත් පෙනෙන්නට සිටියේ නැත. නමුත් සර්වර් කාමරයේ වීදුරු දොර පිටුපසින් කළු පැහැති සෙවණැල්ලක් වේගයෙන් ඇදී යන ආකාරය ඔහුට පැහැදිලිවම දර්ශනය විය.

කවීන්ගේ සටහන: "මේ සතියේ තුන්වෙනි පාරටත් රාත්‍රී 8.05ටම ඒ ශබ්දය ඇසුණා. සර්වර් කාමරයේ දොර අගුළු දමා තිබියදී ඇතුළේ කවුරුහරි ඉන්න බවට බ්ලොග් සටහන් වෙනවා. මෙය තාක්ෂණික දෝෂයක් විය නොහැක."

පසුදින උදෑසන, කාර්යාලය නැවතත් සාමාන්‍ය සේවාදායකයන්ගෙන් සහ සේවකයන්ගෙන් පිරී ගියේය. HR අංශයේ සේවය කරන තාරුකා, ලිපිගොනු වගයක් රැගෙන කවීන්ගේ මේසය අසලට පැමිණියාය.

"කවීන්, ඔයා ඊයේ රෑ සර්වර් රූම් එකේ ලයිට් ඕෆ් කළේ නැද්ද? බොස් මට කෑගැසුවා සිස්ටම් එක අවුල් වෙලා කියලා!" තාරුකා දැතම ඉණට තබාගෙන ඇසුවාය.

"අනේ තාරුකා, මම රෑ 8.30ට යද්දී ඔක්කොම ඕෆ් කළා. ඔයා මට නිකන් චෝදනා කරන්න එපා. මට හිතෙන්නේ ඔයාගේ HR ෆයිල්වල තමා අවුල තියෙන්නේ," කවීන් මඳ සිනහවකින් පිළිතුරු දුන්නේය.

"මොකක්? මගේ ෆයිල්වල අවුලක්? ඔයා IT කිව්වට සර්වර් එකේ පාස්වර්ඩ් එකවත් මතක තියාගන්න බැරි කෙනෙක්නේ!" තාරුකා තරහෙන් රේඩියේටරය දෙසට ගියාය. නමුත් ඇගේ දෑස්වල තිබුණේ සෙල්ලක්කාර බවකි.

අටවැනි තට්ටුවේ කෙළවරේම පිහිටි 804 අංකය දරන කාමරය වසර පහක සිට අගුළු දමා තිබුණි. එහි පිටත "බඩු ගබඩාව ඇතුළුවීම තහනම්" ලෙස පුවරුවක් අලවා තිබුණද, කිසිවෙකුත් එම කාමරයට යනු දැක තිබුණේ නැත. එදින පස්වරුවේ, කවීන් සහ ඔහුගේ හොඳම මිතුරා වූ රමේෂ් තේ පානය කරමින් සිටියහ. රමේෂ් යනු කාර්යාලයේ සිටින ප්‍රධානතම විහිළුකාරයාය.

"මචං කවීන්," රමේෂ් කෝපි උගුරක් බොමින් කීවේය.

"උඹ දන්නවද 804 කාමරේ රහස? ඊයේ රෑ මම ප්‍රින්ට් එකක් ගන්න යද්දී ඒ කාමරේ ඇතුළෙන් ටයිප් රයිටර් එකක් ටයිප් කරන සද්දයක් ආවා. දැන් කවුද බං ටයිප් රයිටර් පාවිච්චි කරන්නේ? හොල්මනක්වත් IT උපාධියක් ගන්න හදනවද දන්නේ නෑ!"

කවීන් සිනාසුණද ඔහුගේ සිතට බියක් ඇතුළු විය. "උඹ විහිළු නෙවෙයි රමේෂ්. මටත් අමුතු දේවල් වගයක් තේරුණා. අපි රෑට පොඩ්ඩක් බලමුද?"

CCTV වාර්තාව: 2019 ජූලි 14 වන දින අට වැනි තට්ටුවේ සේවය කළ සංජය ප්‍රනාන්දු නැමැති ගිණුම්කරණ නිලධාරියා අන්තිම වරට කාර්යාලයට පැමිණ ඇත්තේ රාත්‍රී 7.45ටය. ඉන්පසු ඔහු ගොඩනැගිල්ලෙන් පිටව ගිය බවට lCCTV දර්ශන නොමැත.

එදින රාත්‍රී 7.30ට පමණ කවීන් සහ තාරුකා අහම්බෙන් මෙන් අටවැනි තට්ටුවේදී හමු වූහ. තාරුකා සිටියේ අතේ ලිපිගොනු වගයක් තබාගෙනය.

"තාරුකා, ඔයත් තාම ගෙදර ගියේ නැද්ද?" කවීන් ඇසීය.

"නෑ කවීන්, බොස් මට 2019 අවුරුද්දේ ඕඩිට් ෆයිල් වගයක් හොයන්න කිව්වා. ඒත් පුදුමෙ කියන්නේ ඒ ෆයිල් එකක්වත් Computer එකේ නෑ," තාරුකා කංසාවෙන් කීවාය.

කවීන් සහ තාරුකා එක්ව 804 කාමරය අසලට පා තැබූහ. හදිසියේම මුළු මහලේම විදුලි බුබුළු එකවර නිවී ගියේය. හදිසි ආලෝක පද්ධතිය (Emergency lights) පමණක් රතු පැහැයෙන් දැල්වෙන්නට විය. පරිසරය බියකරු ස්වරූපයක් ගත්තේය.

"කවීන්... මට බයයි," තාරුකා නොදැනුවත්වම කවීන්ගේ අත තදින් අල්ලා ගත්තාය. ඇගේ අත් සීතල වී තිබුණි.

"බයවෙන්න එපා තාරුකා, මම ඉන්නවා," කවීන් ඇගේ අත අල්ලා ගනිමින් පැවසීය. එම මොහොතේදී දෙදෙනාගේම සිත් තුළ අමුතුම ලංවීමක් ඇති විය.

එක්වරම කවීන්ගේ ජංගම දුරකථනයට ඊමේල් පණිවිඩයක් පැමිණියේය. එය යොමු කර තිබුණේ ආයතනයේ අක්‍රිය වූ පැරණි සර්වර් ලිපිනයකිනි.

නොදන්නා ලිපිනයකින්:

"සත්‍යය සොයන්න එපා. 804 ඇතුළේ තියෙන්නේ ඔබ දරාගත නොහැකි සත්‍යයක්. රොහාන් දෙස අවධානයෙන් සිටින්න."

"මේක... මේක සංජයගේ පරණ ඊමේල් අයිඩී එක නේද?" තාරුකා පුදුමයෙන් ඇසුවාය. "සංජය නැතිවෙලා අවුරුදු පහකට පස්සේ කොහොමද මෙහෙම මැසේජ් එකක් එන්නේ?"

කවීන් සහ තාරුකා පසුදින ආරක්ෂක නිලධාරී සුනිල් අයියාව හමුවීමට තීරණය කළහ. සුනිල් අයියා තේ කෝප්පයක් තොලගාමින් වටපිට බලා කතා කරන්නට විය.

"පුතේ... 2019 ඒ රාත්‍රියේ සංජය මහත්තයායි, රොහාන් මහත්තයායි අතර ලොකු රණ්ඩුවක් වුණා. ඊට පස්සේ සංජය මහත්තයා ආයේ එළියට ආවේ නෑ. පහුවදා බලද්දී 804 කාමරේ ඉබ්බා දාලා තිබුණා. බොස් කිව්වා සංජය රස්සාවෙන් අයින් වෙලා ගියා කියලා. ඒත් මට විශ්වාස නෑ..."

සිකුරාදා රාත්‍රියේ මුළු කාර්යාලයම හිස් වූ පසු කවීන් සහ තාරුකා 804 කාමරයේ අගුල කඩන්නට තීරණය කළහ. රමේෂ් දොර ළඟ මුර සිටියේය.

"මචං ඉක්මන් කරපන්, රොහාන් බොස් තාම තට්ටු පහේ ඉන්නවා!" රමේෂ් බයෙන් පැවසීය.

කවීන් අගුල කඩා දමා දොර හැරියේය. කාමරය තුළ තිබුණේ තද දූවිලි ගඳකි. පැරණි ලිපිගොනු සහ පරිගණක කොටස් මැද, ලේඛන අඩංගු යකඩ සේප්පුවක් විය. තාරුකා එහි තිබූ ලිපිගොනුවක් අතට ගත්තාය.

"කවීන්, බලන්න මේක! මේක ආයතනයේ කෝටි ගණනක මුදල් වංචාවක් පිළිබඳ වාර්තාවක්. සංජය මේක හොයාගෙන තියෙනවා. ඒ වාර්තාවේ යටින් තියෙන්නේ...." තාරුකාගේ කටහඬ වෙව්ලන්නට විය.

හමු වූ රහස් ලේඛනය: 2019 වර්ෂයේ සිදු වූ ඇමරිකානු ඩොලර් මිලියන 2 ක වංචාව සඳහා අත්සන් කර ඇත්තේ Operation Manager රොහාන් බණ්ඩාර සහ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියෙකු විසිනි.

හදිසියේම කාමරයේ දොර වැසුණි. පිටතින් අගුළු දැමෙන ශබ්දය ඇසුණි. කාමරය තුළ උෂ්ණත්වය වේගයෙන් පහළ යාමට පටන් ගත්තේය. වීදුරු ජනේල මත සීතල වාෂ්ප බැඳෙන්නට විය.

"අපිට රොහාන් බොස් අහුවුණා!" තාරුකා කෑගැසුවාය. නමුත් කවීන් දුටුවේ ජනේලය මත ලියැවෙන අකුරු වගයකි. කිසිවෙකුත් නැතිව, හිස් වාතයේ සීතල වාෂ්ප මත අකුරු ලියැවුණි:

"සංජය මියගියේ නැත. ඔහු ඔබ අතරම සිටී."

දොර එකවරම විවර විය. පිටත සිටියේ ආරක්ෂක සුනිල් අයියා සහ රොහාන් බණ්ඩාරයි. රොහාන්ගේ මුහුණේ තිබුණේ බිය සහ කලබල බවකි.

"ඔයගොල්ලෝ මොකද මෙතන කරන්නේ?" රොහාන් කෑගැසුවේය.

"මම දන්නවා ඔබලා මේ ලේඛන හොයන බව. ඒත් ඔබලා හිතන දේ වැරදියි!"

කවීන් ඉදිරියට පැමිණියේය.

"තවත් බොරු කියන්න එපා රොහාන්! ඔයා තමා

සංජයව අතුරුදහන් කරලා මේ වංචාව කළේ!"

රොහාන් හිස බිමට හරවා ගත්තේය. "නෑ කවීන්... මම නෙවෙයි වංචාව කළේ. සංජය තමා ඒ වංචාව කළේ! මම සංජයව අල්ලගන්න හදද්දී ඔහු මට පහර දීලා පැනලා ගියා. ඒත් ඔහු පැනලා ගියේ විදේශයකට. ඔහු මගේ නම විනාශ කරන්න මේ ගොඩනැගිල්ලේ IT සිස්ටම් එකට Remote acces එකක් දාලා හැමදාම රෑට අමුතු දේවල් කළා!"

විශාල හෙළිදරව්වෙ සැබෑ ලෙසම සිදු වී තිබුණේ සංජය විසින් සමාගම් මුදල් වංචා කර විදේශයකට පලා යාමයි. ඔහු තම වරද සඟවා ගැනීම සඳහා අටවැනි තට්ටුවේ ස්මාර්ට් සිස්ටම් පාලනය කරමින් හොල්මන් අවතාර ඇති බවට අන්‍යයන් ලවා විශ්වාස කරවා තිබුණි.

සියල්ල පැහැදිලි විය. සැබෑ 'හොල්මන' තාක්ෂණය භාවිත කරමින් විදේශයක සිට පාලනය කළ සංජයගේ සයිබර් ප්‍රහාරයක් පමණි. පොලිසිය විසින් පර්යේෂණ ආරම්භ කර සංජයව ජාත්‍යන්තර පොලිසිය හරහා අත්අඩංගුවට ගැනීමට කටයුතු සම්පාදනය කරන ලදී.

මාසයකට පසු.... කවීන් සහ තාරුකා කාර්යාලයේ බැල්කනියේ සිට සවස අහස දෙස බලා සිටියහ. ඔවුන්ගේ ආදරය දැන් මුළු කාර්යාලයම දන්නා ප්‍රසිද්ධ රහසකි.

"අන්තිමේදී හැමදේම විසඳුණා නේද කවීන්?" තාරුකා කවීන්ගේ අතින් අල්ලා ගනිමින් ඇසුවාය.

"ඔව් තාරුකා... දැන් අටවැනි තට්ටුවේ කිසිම රහසක් නෑ," කවීන් සිනාසෙමින් පැවසීය.

ඔවුන් දෙදෙනා නික්ම ගිය පසු, පාලුවට ගිය අටවැනි තට්ටුවේ පරිගණක තිරයක් එකවරම දැල්වුණි. එහි ස්ක්‍රීන් එක මත රතු පැහැයෙන් සටහන් විය:

"ඔබ සිතන්නේ සංජය යනු මිනිසෙකු කියාද? මම තවමත් මෙහි සිටිමි..."

නිලා



දයාබර දියණියේ

සදාකාලික කඳුලක් හද ගැබ තුළ විලාප නගන මේ මොහොතේ කෙඩැරී වී ගිය ආත්මයකින් යුතුව මට ඔබ අමතන්නට සිත් වූයෙමි. ඒත් මේ කිසි දෙයක් වටහා ගන්නට ඔබ මා අසළ නොවීය. ජීවිතයේ මට දුන් දෙය මේ යැයි කියමින් සිත රවටා ගන්නට මට සිදුව ඇත. දෙවියන් මට දුන් දෙය මටත් නොකියාම රැගෙන ගොස් ඇති බව මම කෙසේ සිතන්නද.

"අම්මේ... බත් උයලා ඉවරයි. කන්න එන්නෝ... යි" කියමින් ඔබ මිත්තනිය සමඟ මිදුගේ කෙණක වැලිබත් පිසූ අවධිය මට සිහිවිය. සෑම වාරයකම පන්තියේ පළවෙනියා වී අම්මේ.... මට... තෑගි කෝයි යී කියමින් මා වෙත දුව ආ අවධිය සිහි විය. ඔබ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී නගරයේ උසස් විද්‍යාලයකට ඇතුළු වන්නට සුදුසුකම් ලැබූ දිනයේ ඔබේ පියාටත් මටත් දැනුන සතුට සදාකාලිකයි. අප එදා සිතීය. රැය දුටු සිහිනයක් සේ අපේ ලෝකය අද කඩා වැටී ඇත. දයාබර දියණියේ ඔබට වටහා දෙන්නට කොතරම් දේ තිබුණේද?

දඟකාරියක ලෙස දුව පැන ගිය අවධියේ පුංචි ඔබේ ලෝකය දෙස අප සිනා සෙමින් බලා සිටියෙමු. නැවුම් කලෙන් දිය නාගෙන ගෙට ගොඩ වී දෙපා මුල දණ ගසා වඳිද්දී අප දෙදෙනාගේම දෙඇසේ මතුවූ කඳුලැලි මට තවම මතකය.

"රත්තරන් සිහිනයක් සේ අපේ ප්‍රාර්ථනා සඵල කරදෙන්නැයි" මම එදා ඔබේ නළල සිප පැවසුවා ඔබට මතකද? සියලු සිදුවීම් සුන්දරත්වයෙන් ගලාගෙන ඉදිරියට යද්දී, නොසිතූ ලෙස අපේ පුංචි ලෝකය මාරුතයකට හසුවිය. පෙරදා පැවති සාමකාමී බව, ප්‍රියමනාප බව හොරු අරන් ගිහිල්ලාවෝ මට සිතුණි.

දයාබර දියණියේ දඟකාරී වූ ජීවිතයෙන් මිදී, ඔබ වෙනත් මඟක ගමන් කරන්නට යන්න දරන බව අපට සාක්ෂි ලැබී තිබුණි. ඒ සියලු දේ සත්‍යයැයි අප පිළිගත්තේ හැකි වුවද එකම දේ බොහෝ දෙනෙක්ම පවසන විට පිළිනොගන්නේ කෙසේද? අවසානයේ ඔබෙන් ඒ සියල්ල ඇසූ විට ඔබ ඉකිබිඳු හැඬූ අයුරු මට මතකය.

"අනේ නැහැ අම්මෙ, එනෙම් දෙයක් නැහැ. යනුවෙන් ඉකිබිඳුම් අතුරින් සිබ පැවසූවාය. ඔබ පැවසුවේ මුසාවක් බව කියමින් ලොවෙන් ආරංචි ගලා එන්නට විය. ඔබේ ලෝකයේ නිදහස ඇහිරිණි. ඔබට අනේක විද වේදනා දෙන්නට අපට සිදු විය. වදනකුදු කතා නොකර අපේ ලෝකයෙන් ඔබ වෙන් කොට දමා තිබුණි. ඔබට අනේක වාරයක් අවවාද දී අපද වෙහෙස වී සිටි හෙයින් ඔබ පිළිබඳ අනුකම්පාව ක්‍රමයෙන් ගිලිහී යන්නට වූහ.



මාස දෙකකට අධික කාලයක් මූණ සඟවාගෙන ඔබ ඔබේ කුටියේ තනිවම ජීවත් වූ බව සිහි වන විට මට මා ගැනම කලකිරීමක් දැනේ. මලක් සේ පිරිසිදු වූ කිසිදු අඩුවකින් තොරව රැක ගන්නට උත්සහ කළ ඔබ අපට විරුද්ධ වෙද්දී අපේ සිතද දරුණු වූ බව පැවසීම නුවුමනාය. ජීවිතයේදී නොසිතූ දේ බොහෝ සිදු වන්නට පුළුවන. අවුරුදු ගණනාවක් ඇසුරු කළද අන් අයෙකු තේරුම් ගැනීමට බොහෝ අසීරුය. අපටත් සිදු වූයේ එය නොවේද? ඔබ තේරුම් ගැනීමට අපොහොසත් වීම මේ සියල්ලටම මුල නොවේද?

ඇතැම් දිනවල රාත්‍රියේ ඔබ නිදා සිටින යහන අද්දරට පැමිණ ඔබ හිස අත හා මා කදුළු සැලූ බව ඔබ නොදන්නේය. එකම වහල යට සිට මුහුණට මුහුණ හමු වූ විටද නොදුටු සේ තම කුටියට පැමිණෙන ඔබ පිළිබඳ මට තරහක් නම් සිතුනේ නැත. දෝතින් මුහුණ වසා ගත් ඔබ හොර රහසේ ඉකි බිඳින මොහොතක් මා නෙත ගැටුණි. ඔබ අසලට පැමිණ ඇයි දූ අඬන්නේ?" අසන්නට මට සිතුනද ඔබ මෙන්ම මුරණ්ඩු මසිත එයට ඉඩ නොදුන්නේය.

මම කොහොමද හැම දේම කියන්නේ මිනිස්සුන්ට



ඕනෑ විදිහට නොවේ මම වැඩ කරන්නේ... ඔබේ මුවින් ගිලිහුණු ඒ වදනත් සමඟ පියාගේ දරුණු පහරකට ඔබ ලක් වූ බව මට මතකය. පුංචි කාලයේ නම් අ...ම්...මේ... තාත්තා මට ගැහුවා... කියමින් මාගේ තුරුලට පනින්න මාගේ දයාබර දියණියේ... එකදු කඳුළකදු සේ ඒ මෙහොතේ සිටියා නොවේද... ඒ තරම්ම දරුණු පහරක් ඉදිරියේවත් නොහැඬූ ඔබ හොර රහසේ හැඬීමට හේතුව කුමක්ද? එය තේරුම් ගන්නට මා මීට වඩා ඉක්මන් වූවා නම් සියල්ල යහපත් වන්නට ඉඩ තිබුණි. ඔබත් ඔවුත් අතර නොතිබූ සම්බන්ධයක් නැත කියමින් මුලු ලොවම ඔබට චෝදනා කරක විට අපද ඔබ කොන් කලා නොවේද? ඇයි කවුරුත් මාව විශ්වාස නොකරන්නේ යි ඔබ දිනක් ඔබේ යෙහෙළියකට කියා තිබුණි. දැඩි පාලු මූසල බවක් නිවෙස පුරාම පැතිරිණි. ඒ පාසුව යළින් නම් කිසිදු දිනෙක වියැකෙන්නේ නම් නැත.

ඈත කොනක අසුනක හිඳ හිස් බැල්මෙන් බලා සිටින ඔබ පියා මට දිස් විය. දින තුනක් තිස්සේ සිබ වෙනුවෙන් වෙහෙසුන... සියලු දෙනාම ගිමන් හරිනවා වන්නට ඇති. ඔබ පියා අසළට යන්නට, මට අවශ්‍ය වුව ද - ඔහුගේ දෙනෙත් දෙස බලමින් ඉකිබිදන්නට නොහැකි හෙයින් මම එසේ නැවතුනි, ඔබ අප දෙදෙනා මේ සා යෝධ පවුරක තනි කරදා යන්නට ගියේ ඇයි... ඔබට අපව ඒ තරමටම පිළිකුල් වුවාද? මුලු ලොවෙහි අපහාස චෝදනා නිමක් නැතිව එල්ල වෙද්දී... සිද්ධ කෙහොම දරා ගන්නද?

එයා අම්මා, තාත්තා නැති අසරණ කෙනෙක් අම්මේ ඒ වගේම හොඳ කරන්න බැරි අසනීපයක් එයාට තියනවා අම්මා, තාත්තා නැතිව මැරෙන්න නියම වෙලා ඉන්න ඒ තරුණයාගේ හිත සුවපත් කරන්න විතරයි මට ඕනා වුනේ. එයින් මා ලැබූ ආත්මීය සතුට කොතරම්ද... ඔබේ ලිපියේ තැනක එලෙස සටහන්ව තිබුණි. කිසිදු හේතුවක් නොමැතිව මේ ලෝකයෙන් සමුගන්නට තරම් ඔබ කෙතරම් පීඩාකාරී ජීවිතයක් ගෙවන්නට ඇත්ද? ඒ පීඩාව මා නුදුටුවේ ඇයි?..

පෙරේදා හවස මා ඔහුත් සමඟ කෙහේදෝ ඇවිද ගිය බවට සාක්ෂියක් රැගෙන ඔබ මා ඉතාමත් අසාධාරණ ලෙස තලා පෙළා දැමීය. ඒත් දයාබර අම්මේ මීට දින හතකට පෙර ඉතාමත් අසාධ්‍ය තත්ත්වයෙන් යුතුව ඔහු මහරගම පිළිකා රෝහලට ඇතුලු කලා. එසේ නම් මා ඔහුත් සමඟ ඇවිද ගියේ කෙසේද? ඒ සිදුවීම හා දැඩි පීඩාවට ලක් කළේය. ඔහුත් මාත් අතර නොතිබූ සබඳකමක් ගැන පවසමින් මා වින්ද අනේක දුක් වේදනා අදින් පසු නිමා වනු ඇත. ඒ අහිංසක තරුණයා වෙනුවෙන් ඔබට කළ හැකි දෙයක් ඇත්තම් ඉටුකරන්න.. ඒ මගේ ඉල්ලීමයි. ජීවිතයෙන් පලා යාම් නිවැරදි යැයි මා නොසිතමි, එත් මා විශ්වාස කරන කිසිවෙක් නොමැති ලෝකයක තව දුරටත් හා වෙනුවෙන් රැඳෙන්නද?

දයාබර දියණියේ මේ ලෙස ලිපියක නොලියා මට පැවසුවේ නම්.... ඔබ තවමත් මගේ සුරතල් දියණිය නොවේද

ඔබට මෙන්ම මටද කියන්නට බොහෝ දේ තිබුණ ද, ඒ සියල්ල කීමට ඉඩ නොතබා කාලය විසින් අප දෙපැත්තකට පේද කොට දැමීය.

මිදුලට බට මම ගොක් කොළ සැරසිලි දිගේ ඔහේ ඇවිද ගියෙමි. වැට මායිමේ පොල් ගසක ඔබ සිනාසෙමින් සිටිනවා දුටුමි. ඒත් එය දැන්වීමකි. මම එය කියවීමි.

අකාලයේ මරු වැළඳගත්

සයුරි නිසංසලා කුල කුමරියට

නිවන් සැපත ලැබේවා!

අයි.පී. ගුණතිලක

සේවා අංක - 915
පුත්තලම ශාඛා කාර්ය

පහ වසර ශිෂ්‍යත්ව ප්‍රදානය

















චාවකච්චේරි නව කාර්යාලය







ඵලදායිතාව පුහුණු වැඩසටහන















ශිෂ්‍යත්ව උපකාරක සම්මන්ත්‍රණය















විශේෂ නිවේදනයයි

හදිසි ආපදා තත්ත්වය හමුවේ පීඩාවට පත්ව ඇති EDCS සාමාජික භවතුන්ගේ අවධානයට....

වත්මන් අයහපත් කාලගුණික තත්ත්වය හමුවේ සමිතියේ සාමාජික ඔබහට සිදුව ඇති හදිසි ආපදාවන් හඳුනාගත යුතුව ඇත.
ඒ සඳහා ඔබගේ තොරතුරු පහත ආකාරයට ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

ඔබ අයත් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් අධීක්ෂණ මහා සභා නියෝජිතයා/
මහා සභා නියෝජිතයා/පළාත් අධ්‍යක්ෂ වෙත
තොරතුරු ලබා දීමට කටයුතු කරන්න.
නැතහොත්
070 477 5934 දුරකතන අංකය වෙත
ඔබගේ සාමාජික අංකය, නම, අධ්‍යාපන කලාපය හා දිස්ත්‍රික්කය සඳහන් කරමින්
Whatsapp පණිවිඩයක් යොමු කරන්න.

ලාල් කුමාර - ප්‍රධාන සභාපති 077 803 0720
ශ්‍රීශාන්ත කවිකාර - ප්‍රධාන ලේකම් 071 800 8726

EDCS













EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society
අද
වවුනියාවට






EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society




COMMERCIAL


EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society
இன்று
வவுனியாவுக்கு

සරසවි ශිෂ්‍යත්ව ප්‍රදානය

EDCS සිසු නැණ ප්‍රණාම
සරසවි ශිෂ්‍යාධාර පුදාතෝත්සවය

EDCS சிசு நெண மிரணாம
பல்கலைக்கழக மாணவர்களுக்கான
புலமைப்பரிசில் வழங்கும் விழா

























මහරගම නව ශාඛා කාර්යාලය













REBUILDING SRI LANKA



අධ්‍යාපන සමූපකාර සමිති ශාඛා කාර්යාල තොරතුරු

01. කොළඹ ශාඛාව

ලිපිනය: අංක 294, ගාලු පාර, කොළඹ 03
දුරකථන: 011-25 75 739
විද්‍යුත් තැපෑල: edcscolombo@gmail.com

02. ගාල්ල ශාඛාව

ලිපිනය: අංක 28 1/1, ඔල්කට් පාර, ගාල්ල
දුරකථන: 091-22 25 217/18
විද්‍යුත් තැපෑල: edcssouth@gmail.com

03. ගම්පහ ශාඛාව

ලිපිනය: අංක 08, BLCB, "නිවාහන",
පාසල් පටුමඟ, ගම්පහ
දුරකථන: 033-22 30 662
විද්‍යුත් තැපෑල: edcsgampaha@gmail.com

04. කළුතර ශාඛාව

ලිපිනය: අංක 264/1/1, ගාලු පාර, උතුරු කළුතර
දුරකථන: 034-22 21 496
විද්‍යුත් තැපෑල: edcskaluthara@gmail.com

05. මහනුවර ශාඛාව

ලිපිනය: අංක 21, කටුකැලේ වැව පාර, මහනුවර
දුරකථන: 081-22 05 616/17
විද්‍යුත් තැපෑල: edcskandy@gmail.com

06. මොණරාගල ශාඛාව

ලිපිනය: අංක 134/14, නව බස් නැවතුම්පොළ පාර,
මොණරාගල
දුරකථන: 055-22 77 452
විද්‍යුත් තැපෑල: edcsmonaragala@gmail.com

07. කුරුණෑගල ශාඛාව

ලිපිනය: අංක 37, මීගමුව පාර, කුරුණෑගල
දුරකථන: 037-22 32 985/86
විද්‍යුත් තැපෑල: edcskurunagala@gmail.com

08. පුත්තලම ශාඛාව

ලිපිනය: අංක 128/ක, පුත්තලම පාර, හලාවත
දුරකථන: 032-22 24 553
විද්‍යුත් තැපෑල: edcsputtalam@gmail.com

09. රත්නපුර ශාඛාව

ලිපිනය: අංක 574, නව නගරය, රත්නපුර
දුරකථන: 045-22 22948
විද්‍යුත් තැපෑල: edcssab2@gmail.com

10. කෑගල්ල ශාඛාව

ලිපිනය: අංක 286/1, කොළඹ පාර, රංවල, කෑගල්ල
දුරකථන: 035-20 51 923
විද්‍යුත් තැපෑල: kegalleedcs2013@gmail.com

11. අනුරාධපුර ශාඛාව

ලිපිනය: අංක 250, සල්ගාදු ක්‍රීඩාංගණය ඉදිරිපිට,
මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර
දුරකථන: 025-22 26 733/34
විද්‍යුත් තැපෑල: edcsanu@gmail.com

12. පොළොන්නරුව ශාඛාව

ලිපිනය: පොළොන්නරුව නගර මධ්‍යස්ථාන සාප්පු
සංකීර්ණය, 3 වන මහල, පොළොන්නරුව
දුරකථන: 027-22 26 243
විද්‍යුත් තැපෑල: edcspolonnaruwa@gmail.com

13. හම්බන්තොට ශාඛාව

ලිපිනය: අංක 81/1, තිස්ස පාර, තංගල්ල
දුරකථන: 047-22 40 011
විද්‍යුත් තැපෑල: edcshambantota@gmail.com

14. මාතර ශාඛාව

ලිපිනය: අංක 45 ඊ 2/1, අනගාරික ධර්මපාල මාවත,
මාතර
දුරකථන: 041-22 32 171
විද්‍යුත් තැපෑල: edcsmatara@gmail.com

15. නුවරඑළිය ශාඛාව

ලිපිනය: අංක 50, මහනුවර පාර, නුවරඑළිය
දුරකථන: 052-22 23 465
විද්‍යුත් තැපෑල: edcsnuwaraeliya@gmail.com

16. මාතලේ ශාඛාව

ලිපිනය: අංක 158, කිංග්ස් වීදිය, මාතලේ
දුරකථන: 066-20 55 620
විද්‍යුත් තැපෑල: edcs'matale@gmail.com

17. බදුල්ල ශාඛාව

ලිපිනය: අංක 226/4/2/21, මොඩර්න් සංකීර්ණය,
පහළ වීදිය, බදුල්ල
දුරකථන: 055-22 24 461/62
විද්‍යුත් තැපෑල: edcsbadulla@gmail.com

18. අම්පාර ශාඛාව

ලිපිනය: අංක 693, මල්වත්ත පාර, අම්පාර
දුරකථන: 063-22 24 168/69

විද්‍යුත් තැපෑල: edcsampara@gmail.com

19. මඩකලපුව ශාඛාව

ලිපිනය: අංක 56, ගෝවින්දන් පාර, මඩකලපුව
දුරකථන: 065-22 26 638/39
විද්‍යුත් තැපෑල: edcsbatti@gmail.com

20. ත්‍රිකුණාමලය ශාඛාව

ලිපිනය: අංක 455/1, ආනන්දකුලම, මහනුවර පාර, ත්‍රිකුණාමලය
දුරකථන: 026-20 51 689
විද්‍යුත් තැපෑල: edcstrincomalee@gmail.com

21. චාවකච්චේරි ශාඛාව

ලිපිනය: අංක 22, මහනුවර පාර, චාවකච්චේරි
දුරකථන: 021-22 83 540/41
විද්‍යුත් තැපෑල: edcsnorthern@gmail.com

22. වවුනියාව ශාඛාව

ලිපිනය: අංක 52/4, දෙවන හරස් වීදිය, වවුනියාව
දුරකථන: 024-22 25 878
විද්‍යුත් තැපෑල: edcsvavuniya@gmail.com

කලාපීය කාර්යාල


23. මහරගම - කොළඹ කලාපීය කාර්යාලය
ලිපිනය: අංක 75, හයිලෙවල් පාර, මහරගම.
දුරකථන: 011 - 22 79 444 / 011 - 22 79 166

24. කැලණිය - ගම්පහ කලාපීය කාර්යාලය
ලිපිනය: අංක 440/1/C, සතොස ගොඩනැගිල්ල, මහනුවර පාර, රන්මුතුගල, කඩවත
දුරකථන: 033-23 11 288

25. කුලියාපිටිය - කුරුණෑගල කලාපීය කාර්යාලය
ලිපිනය: අංක 149/6, මාදම්පේ පාර, කුලියාපිටිය.
දුරකථන: 037-31 53 842

26. දෙහිඕවිට - කෑගල්ල කලාපීය කාර්යාලය
ලිපිනය: "A", ප්‍රාදේශීය සභා වෙළෙඳ සංකීර්ණය, දෙහිඕවිට.
දුරකථන: 036-22 69 444







පී.එස්. ධනංජී
EDCS මාතර

